JMC vLearning
"your virtual learning partner"

# හවුල් ව්‍යාපාර ගිණුම්කරණය
# Partnership Accounting

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# හවුල් ව්‍යාපාර පිළිබඳ හැඳින්වීම

# Introduction to Partnership

## නිර්වචනය - Definition

1890 හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව හවුල් ව්‍යාපාරයක් යනු, ලාභ ලැබීමේ පොදු චේතනාවෙන් ව්‍යාපාරයක් කරගෙන යන පුද්ගලයන් අතර පවතින ව්‍යාපාරික සම්බන්ධතාවය වේ.

The partnership act 1890 defines the partnership as "The relationship which subsists between persons carrying on a business in common with view of profit.

ඒ අනුව හවුල් ව්‍යාපාරයක් වීමට ඉටුවිය යුතු මූලික අවශ්‍යතා 04 කි.

1. ලාභ ඉපයීමේ අපේක්ෂාවෙන් පැවැත් වීම.
2. පුද්ගලයන් කිහිපදෙනකු සිටීම.
3. ව්‍යාපාරිකමය සම්බන්ධතාවයක් පැවතීම.
4. පොදුවේ කටයුතු කිරීමට පුද්ගලයන් අතර අන්‍යෝන්‍ය එකඟතාවයක් පැවතීම.

අනෙකුත් ව්‍යාපාර සංවිධාන හා සැලකීමේදී හවුල් ව්‍යාපාරයක් සම්බන්ධව පහත විශේෂිත ලක්ෂණ ද දැකිය හැක.

1. නෛතික පුද්ගලභාවයක් නොපැවතීම.
2. හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වීම.
3. අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.

## හවුල් ව්‍යාපාර වර්ග

1. සීමාරහිත හවුල් ව්‍යාපාර/සාමාන්‍ය හවුල් ව්‍යාපාර (Unlimited Partnership)

   සියලුම හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වේ. බාහිර වගකීම් පියවීම සඳහා යෙදූ ප්‍රාග්ධනයට අමතරව ස්වකීය පෞද්ගලික දේපළ ද වැය කිරීමට සිදු වේ.

2. සීමාසහිත හවුල් ව්‍යාපාර (Limited Partnership)

   යටත් පිරිසෙන් එක් සීමාරහිත හවුල්කරුවෙකු ඇතුලත් වන අනෙක් හවුල්කරුවන්ගේ වගකීම සීමිත වන හවුල්කරුවන් ද ඇතුලත් වන හවුල් ව්‍යාපාර සීමාසහිත හවුල් ව්‍යාපාර වේ.

(1907 සීමිත හවුල් ව්‍යාපාර පනතින් හවුල්කරුවෙකුගේ වගකීම සීමාසහිත කළ එම පනත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නොවන බැවින් සීමාසහිත හවුල් ව්‍යාපාර ශ්‍රී ලංකාවේ හඳුනාගත නොහැක.)

## හවුල් ගිවිසුම් - Partnership Agreement

හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් කිහිපදෙනෙකු (2-20) සිටින බැවින් ව්‍යාපාරිකමය කටයුතු වලදී ඔවුනොවුන් අතර මත භේද ඇති විය හැක. එම තත්ත්වය මඟ හැරීම සඳහා හවුල්කරුවන් අතර අන්‍යෝන්‍ය එකඟත්වයක් පැවතිය යුතුය. එබැවින් හවුල්කරුවන් අතර ආරවුල්මය ස්වරූපයට පත්විය හැකි අනාගත තත්ත්වයන් පිළිබඳ වර්තමාන එකඟත්වයන් ඇති කර ගැනීම දැකිය හැක. මෙම එකඟත්වයන් කොන්දේසියක් ලෙස හඳුන්වයි. එම කොන්දේසි සියල්ලෙහි එකතුවෙන් අවසානයේ හවුල්කරුවන් අතර ගිවිසුමක් නිර්මාණය වේ. ගිණුම්කරණයේදී හවුල්කරුවන් අතර බිහිවෙන ගිවිසුමක ඇතුලත් පොදු කොන්දේසි කිහිපයකි. ඒවානම්,

1. හවුල්කරුවන් ප්‍රාග්ධනයට දායක වන ආකාරය
2. හවුල්කරුවන් අතර ලාභ අලාභ බෙදා ගන්නා ආකාරය
3. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධනය සඳහා පොලී ගෙවීම් කොන්දේසි
4. හවුල්කරුවන් ව්‍යාපාරයට සපයන සේවා වෙනුවෙන් වේතන ගෙවීම් කොන්දේසි
5. ගැනිලි සිදු කළ හැකි ආකාරය සහ ඒ සදහා පොලී අය කිරීම් කොන්දේසි


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

6. හවුල්කරුවෙකු ප්‍රාග්ධනයට අමතරව සැපයූ ණයක් සම්බන්ධව ක්‍රියා කරන ආකාරය
7. හවුල්කරුවෙකු බඳවා ගැනීමේදී,
   i. කීර්තිනාමය
   ii. ප්‍රත්‍යාගණන වැනි ගැලපීම් සිදු කරන ආකාරය
8. හවුල්කරුවෙකු ඉවත්ව යාමේදී,
   i. කීර්තිනාමය
   ii. ප්‍රත්‍යාගණන වැනි ගැලපීම් සිදු කරන ආකාරය

පහත කොන්දේසි පිළිබඳ හවුල්කරුවන් අතර එකඟත්වය (ගිවිසුම) ඇති විය හැකි ප්‍රධාන ආකාර තුනකි.

1. ව්‍යංගව - By Implication
2. වාචිකව - By Oral Agreement
3. ලිඛිතව - By Written Agreement

එබැවින් හවුල් ගිවිසුම් ද ඉහත ස්වභාවයන් 03 යටතෙහි පැවතිය හැක.

❖ **ව්‍යංග ගිවිසුම්**

හවුල්කරුවන් තමන් අතර හවුල් ව්‍යාපාරික සම්බන්ධතාවයක් වාචිකවත්, ලිඛිතවත් නොවන සිය හැසිරීම් තුළින් ඇති කර ගන්නා ගිවිසුම් ව්‍යංග ගිවිසුම් ලෙස හඳුන්වයි.

❖ **වාචික ගිවිසුම්**

හවුල්කරුවන් තමන් අතර ඇති කර ගන්නා වාචික එකඟත්වයන් ඇති කර ගන්නා ගිවිසුම් වාචික ගිවිසුම් ලෙස හඳුන්වයි.

❖ **ලිඛිත ගිවිසුම්**

හවුල්කරුවන් තමන් අතර ඇති කර ගන්නා එකඟත්වයන් ලිඛිතව ලියවිල්ලක ඇතුලත් කර එම ලියවිල්ලට සියළු හවුල්කරුවන් අත්සන් කිරීමෙන් ඇතිවන ගිවිසුම් ලිඛිත ගිවිසුම් ලෙස හඳුන්වයි. මෙම ලිඛිත ගිවිසුම නීතිඥවරයෙකු ලවා සහතික කර ගැනීම ද කළ හැක එවිට එම ගිවිසුම හවුල් ඔප්පුවක් (Partnership Deed) බවට පත් වේ.

හවුල්කරුවන් අතර ගිවිසුම ලිඛිතව පැවති විට එය ඔවුනට වාසි සහගතය, එවිට නීතිමය පිහිට පැතීමට බාධා ඇති නොවේ. එහෙත් ආරම්භක ප්‍රාග්ධනය රු. 1,000 ට වඩා වැඩි විට ගිවිසුම වාචිකව හෝ ව්‍යංගව පැවති විට නීතිමය පිළිසරණ පැතිය නොහැක. (1840 අංක 18 වංචා වැළැක්වීමේ ආඥා පනත) එබැවින් හවුල් ගිවිසුම ලිඛිතව පැවතීම හවුල්කරුවන්ට සෑමවිටම වාසි සහගත වේ.

කෙසේවෙතත් මෙසේ ලිඛිත ගිවිසුමක් නොමැති හවුල් ව්‍යාපාරයකට පැවැත්ම සඳහා, හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියේ විධිවිධාන අදාළ වෙයි.

## හවුල් ව්‍යාපාර වලට අදාල නීතිමය පසුබිම

## පනත්

### i. 1890 හවුල් ආඥා පනත

#### 24 වගන්තිය

1) හවුල්කරුවන් ප්‍රාග්ධනයට සම සමව දායක විය යුතු අතර ලාභ අලාභ සම සමව භුක්ති විඳිය යුතුය.
2) ජංගම ගිණුම් සඳහා පොළිය ගිණුම්ගත නොකළ යුතුය.
3) හවුල්කරුවන්ට ව්‍යාපාරයේ කළමනාකරණය සඳහා සහභාගි විය හැකි අතර ඒ සඳහා වේතන හිමිකම් නැත.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

4) හවුල්කරුවන් ප්‍රාග්ධනයට අමතරව යම් ණය මුදලක් ව්‍යාපාරයට සපයා ඇත්නම් ඒ සඳහා උපරිම වශයෙන් 5% ක පොලී හිමිකම් ඇත - ප්‍රාග්ධනය සඳහා පොලී ගෙවිය නොහැක.

### ii. 1840 වංචා වැලක්වීමේ ආඥා පනත

මෙම ආඥා පනතේ 18 වන වගන්තිය අනුව ආරම්භක ප්‍රාග්ධනය රු. 1,000 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වේ නම්, හවුල් ව්‍යාපාර ගිවිසුම ලිඛිතව පැවතිය යුතු බව දක්වා ඇත. මෙම තත්ත්වයට අනුකූල නොවන හවුල් ව්‍යාපාර ගිවිසුම් අවලංගු ඒවා බව මින් නොහැඟෙන අතර හවුල් ව්‍යාපාරයට නඩු පැවරීමට ඇති අයිතිය සීමා වේ. එහිදී හවුල්කරුවෙකුට තවත් හවුල්කරුවෙකුට එරෙහිව නඩු පැවරිය නොහැක. පේටි එරෙහිව පේටි එහෙත් තෙවන පාර්ශවයට හවුල් ව්‍යාපාරයට එරෙහිව නඩු පැවරීම සීමා නොකරේ.

### iii. 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත

හවුල්කරුවන්ගේ නම් ඇතුලත් නොවන නමකින් ව්‍යාපාරය පවත්වාගෙන යයි නම්, අදාළ විස්තර සපයා ව්‍යාපාර නාමය ලියාපදිංචි කළ යුතු බව මෙම පනතෙන් නිර්දේශ කර ඇත.

### iv. 2007 අංක 07 දරණ සමාගම් පනත

1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ හවුල්කරුවන් සංඛ්‍යාව පිළිබඳ නිශ්චිතව දක්වා නොමැත. හවුල්කරුවන් කිහිපදෙනෙකු යන්නෙන් අදහස් වන්නේ පුද්ගලයන් අවම වශයෙන් දෙදෙනෙකු යන්නයි. එහෙත් කිහිපදෙනෙකු යන්නෙහි උපරිමය පිළිබඳ නිර්දේශයක් නොමැත. 2007 අංක 07 දරණ සමාගම් පනතෙහි ඕනෑම ව්‍යාපාර සංවිධානයක හිමිකරුවන් 20 ට වැඩි වේ නම් සමාගමක් බවට පත් කළ යුතු බව දක්වා ඇත. එහෙයින් හවුල් ව්‍යාපාරයක් ද උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව 20 ට සීමා වේ.

## නඩු තීන්දු

### i. Pate Vs Pate නඩු තීන්දුව

1840 වංචා වැළැක්වීමේ ආඥා පනත 18 වගන්තිය කඩ කළ විට හවුල්කරුවන්ගේ ගැටළු නිරාකරණය කිරීම සඳහා අධිකරණයේ පිහිට ලබා ගත නොහැකි බව.

### ii. ගානර් එදිරිව මරේ නඩු තීන්දුව

හවුලක් විසුරුවා හැරීමේදී බුන්වත් හවුල්කරුගේ වගකීම් කොටස අවශේෂ හවුල්කරුවන් විසින් අවසානයේ එකඟවු ප්‍රාග්ධන අනුපාතය මත දැරිය යුතුයි.

හවුල් ව්‍යාපාරයකට විශේෂිත වු ගිණුම්

1. විසර්ජන ගිණුම
2. ප්‍රාග්ධන ගිණුම්
3. ජංගම ගිණුම්

**මෙලෙස විශේෂිත වු ගිණුම් සකස් කිරීමට හේතුවන සංකල්ප 02 කි.**

**ලාභය බෙදා හැරීමේ අවශ්‍යතාවය**

හවුල් ව්‍යාපාරයේ ලාභය හවුල්කරුවන් විසින් ව්‍යාපාරයට සපයා ඇති දායකත්වය සැලකිල්ලට ගෙන බෙදාහැරීම සඳහා විසර්ජන ගිණුම භාවිතා කෙරේ.

**හිමිකම වෙනම නිරූපණය කිරීමේ අවශ්‍යතාවය**

හවුල් ව්‍යාපාරය සහ හවුල්කරුවන් අතර දිගුකාලින සහ කෙටිකාලින වශයෙන් සිදුවන ගනුදෙනු හේතුවෙන් එක් එක් හවුල්කරුවාට ව්‍යාපාරික සම්පත් වලින් කොපමණ අයිතියක් පවතීද යන්න නිරූපණය කිරීමට ප්‍රාග්ධන හා ජංගම ගිණුම් භාවිතා කෙරේ.

## හවුල් ව්‍යාපාර ගිණුම් වලට අදාළ විශේෂිත ගැලපීම්

1. හවුල්කරුවන්ගේ අයිතිය නිරූපනය කිරීම
2. ශුද්ධ ලාභ අලාභ බෙදා හැරීම
3. හවුල් ව්‍යාපාරයක ලාභ සහ ආදායම සහතික වීම

JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## හවුල්කරුවන්ගේ අයිතිය නිරූපණය කිරීම

හවුල් ව්‍යාපාරයක අයිතිය ප්‍රධාන කොටස් 02 ක් යටතේ හඳුනා ගැනේ,

1. හවුල්කරුවන්ගේ දිගුකාලීන අයිතිය - ස්ථාවර
2. හවුල්කරුවන්ගේ කෙටිකාලීන අයිතිය - ජංගම

ඉහත අයිතීන් වර්ග දෙක වෙනුවෙන් ප්‍රාග්ධන ගිණුම හා ජංගම ගිණුම් නමින් හිමිකම් ගිණුම් දෙකක් හවුල් ව්‍යාපාර පවත්වාගෙන යයි ප්‍රාග්ධන හා ජංගම ගිණුම් හවුල්කරුවන්ගේ හිමිකම් ගිණුම් වන බැවින් හවුල්කරුවන්ගේ ගිණුම් ලෙස ද එම ගිණුම් දෙක හඳුන්වයි.

1. ප්‍රාග්ධන ගිණුම (Capital Account)

   හවුල්කරුවන්ගේ දිගුකාලීනමය අයිතිවාසිකම් ගැලපීම සඳහා පිළියෙල කරණු ලබන ගිණුම ප්‍රාග්ධන ගිණුම ලෙස හඳුන්වයි. මෙම ගිණුමෙහි පවතින ශේෂ කෙටිකාලීනව වෙනස්වීම් වලට ලක් නොවේ. හවුල් ව්‍යාපාරවල පහත ගැලපීම් ප්‍රාග්ධන ගිණුම තුළ සිදු කරනු ලබයි.

   - ප්‍රාග්ධන යෙදීම්
   - කීර්තිනාමය ගැලපීම්
   - ප්‍රත්‍යාගණන ගැලපීම්

   එක් එක් හවුල්කරුවෙකු වෙනුවෙන් වෙන වෙනම ප්‍රාග්ධන ගිණුම් පිළියෙල නොකරන අතර එකම ප්‍රාග්ධන ගිණුම තුළ එක් එක් හවුල්කරුට වෙන වෙනම තීරු සහිතව ගිණුම පිළියෙල කරයි. මෙය අනුතීරු ක්‍රමයට ප්‍රාග්ධන ගිණුම් පිළියෙල කිරීම ලෙස හඳුන්වයි.

### ප්‍රාග්ධන ගිණුමේ ආකෘතිය (හවුල්කරුවන් A B C යැයි සිතමු.)

**ප්‍රාග්ධන ගිණුම්**

| | A | B | C | | A | B | C |
|---|---|---|---|---|---|---|---|
| කීර්තිනාමය(ඉවත් කිරීම) | xx | xx | xx | ශේෂය | xxx | xxx | xxx |
| ප්‍රත්‍යාගණන අලාභ | xx | xx | xx | කීර්තිනාමය(සටහන්කිරීම) | xx | xx | xx |
| | | | | ප්‍රත්‍යාගණන ලාභ | xx | xx | xx |
| ශේෂය ප/ගෙ | xxx | xxx | xxx | මුදල් (ප්‍රාග්ධන යෙදීම) | xx | xx | xx |
| | xxx | xxx | xxx | | xxx | xxx | xxx |
| | | | | ශේෂය ඉ/ගෙ | xxx | xxx | xxx |

ප්‍රාග්ධන ගිණුමෙහි ගණුදෙනු ඇතුලත් කිරීමේ මූලධර්මය වනුයේ,

**දිගුකාලීන අයිතිය අඩුවීම හර**

**දිගුකාලීන අයිතිය වැඩිවීම බැර**

2. ජංගම ගිණුම (Current Account)

   හවුල්කරුවන්ගේ කෙටිකාලීනමය සහ ද්‍රව්‍යශීලමය වූ අයිතියෙහි වෙනස්වීම ගලපනු ලබන ගිණුම ජංගම ගිණුම ලෙස හඳුන්වයි. ජංගම ගිණුමෙහි පවත්නා ශේෂය කෙටිකාලීනව උච්චාවචනයන්ට භාජනය වේ. වර්ෂයකට වඩා අඩු කාලීන පහත ගැලපීම් ජංගම ගිණුම තුළ සිදු කරයි.

   1. ලාභ/ අලාභ කොටස්
   2. ප්‍රාග්ධන පොලී
   3. හවුල් වේතන
   4. හවුල්කරුවන්ගේ ගැනිලි සහ ගැනිලි පොලී
   5. හවුල්කරුවන්ට ව්‍යාපාරයෙන් කළ යුතු වෙනත් ගෙවීම් හා ව්‍යාපාරයට හවුල්කරුවන්ගෙන් කරනු ලබන වෙනත් අයකිරීම්


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

හවුල්කරුවන් කිහිපදෙනෙකු සිටින විට ජංගම ගිණුම් කිහිපයක් පිළියෙල නොකර එකම ජංගම ගිණුමේ එක් එක් හවුල්කරුට වෙන වෙනම තීරු පවත්වා ගනී. එය තීරු ක්‍රමයට ජංගම ගිණුම් පිළියෙල කිරීම ලෙස හඳුන්වයි.

### ජංගම ගිණුම් ආකෘතිය (හවුල්කරුවන් AB සහ C යැයි සිතමු.)

**ජංගම ගිණුම**

| | A | B | C | | A | B | C |
|---|---|---|---|---|---|---|---|
| ශේෂය | - | XX | - | ශේෂය | XX | - | XX |
| ගැනිලි | XX | XX | XX | ප්‍රාග්ධන පොලී | XX | XX | XX |
| ගැනිලි පොලී | XX | XX | XX | වේතන | XX | XX | XX |
| ජංගම ගිණුම් පොලී | - | XX | - | ජංගම ගිණුම් පොලී | XX | - | XX |
| හවුල්කරුවන් වෙනුවෙන් ව්‍යාපාරය වියදම් දැරීම | XX | XX | XX | ලාභ කොටස් | XX | XX | XX |
| | | | | හවුල්කරුවන් ගෙවිය යුතු වෙනත් දෑ | XX | XX | XX |
| | | | | ව්‍යාපාරය වෙනුවෙන් හවුල්කරුවන් දැරූ වියදම් | XX | XX | XX |
| ශේෂය ප/ගෙ | XX | XX | XX | | | | |
| | XX | XX | XX | | XX | XX | XX |
| | | | | ශේෂය ඉ/ ගෙ | XX | XX | XX |

**සැ.යු.** අලාභ කොටස් පවතීනම් ජංගම ගිණුමට අලාභ කොටස් ලෙස හර කරනු ලැබේ.

ජංගම ගිණුමට ගණුදෙනු ඇතුලත් කිරීමේ මූලධර්මය වනුයේ,

**කෙටිකාලීන අයිතිය අඩු වීම**
**(හවුල්කරුවන්ගෙන් ව්‍යාපාරයට කළ යුතු අයකිරීම්)** } **හර**

**කෙටිකාලීන අයිතිය වැඩි වීම**
**(ව්‍යාපාරයෙන් හවුල්කරුවන්ට කළ යුතු ගෙවීම)** } **බැර**

## උදාහරණ - 01

පහත සඳහන් අයිතම වාර්තා කළ යුත්තේ ප්‍රාග්ධන ගිණුමටද, ජංගම ගිණුමටද යන වග දක්වන්න.

1. හවුල්කරුවන්ගේ භාණ්ඩ ගැනිලි
2. වාර්ෂික ලාභ කොටස්
3. කීර්තිනාමය සටහන් කිරීම
4. ප්‍රාග්ධන පොලී
5. හවුල්කරුවන්ට හිමි වේතන
6. හවුල්කරුවන් මුදලින් ගත් වේතන
7. අමතර ප්‍රාග්ධන යෙදීම
8. ප්‍රාග්ධනයේ කොටසක් ලෙස හවුල්කරු භාර ගත් මෝටර් රථය
9. හවුල්කරුවන්ගේ මුදල් ගැනිලි
10. කීර්තිනාමය කපා හැරීම
11. ප්‍රත්‍යාගණන ලාභ
12. ව්‍යාපාරය දැරූ හවුල්කරුවන්ගේ පෞද්ගලික වියදම


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### ප්‍රාග්ධන පොළී ගැලපීම

හවුල්කරුවන් විසින් යොදන ලද ප්‍රාග්ධනය වෙනුවෙන් පොලියක් හවුල් ව්‍යාපාරයෙන් ලබා දීම පිළිබඳ කොන්දේසි හවුල් ගිවිසුමෙහි ඇතුලත් කරගත හැක.

### ප්‍රාග්ධන පොළී ගැලපීමේ වැදගත්කම

1. හවුල්කරුවන් විසින් අසමාන ලෙස ප්‍රාග්ධනය සපයා ඇති විට ඔවුන් අතර සාධාරණව ලාභ බෙදා හැරීම සඳහා.
2. හවුල්කරුවන් ව්‍යාපාරයට යොදා ඇති ප්‍රාග්ධන මුදල්වල ආවස්ථික පිරිවැය ව්‍යාපාරයෙන් ලබා දීම. (වෙනත් ආයෝජනයකින් ලැබිය හැකි පොලිය අය කර දීම)
3. යෙදූ ප්‍රාග්ධනය ස්ථාවරව රඳවා ගැනීමට හැකි වීම.
4. අමතර ප්‍රාග්ධනය දිරිමත් කළ හැකි වීම.
5. ව්‍යාපාරයේ ලාභ නොපැවතිය ද ප්‍රාග්ධන පොළී ලෙස ආදායමක් අඛණ්ඩව හවුල්කරුවන්ට ව්‍යාපාරයෙන් ලබා දීම.

වාර්ෂික ශුද්ධ ලාභයෙන් ප්‍රාග්ධන පොළී ප්‍රතිපාදනය කිරීමේ ද්විත්ව සටහන වනුයේ,

| | |
|---|---|
| **ලාභ අලාභ විසර්ජන ගිණුම** | **හර** |
| **ජංගම ගිණුම** | **බැර** |

ප්‍රාග්ධනය සඳහා අදාළ වන පොලිය ගණනය කළ හැකි ප්‍රධාන ක්‍රම තුනකි.

1. ආරම්භක ප්‍රාග්ධන ශේෂ සඳහා පොලී ගණනය කිරීම.
2. අවසන් ප්‍රාග්ධන ශේෂ සඳහා පොලී ගණනය කිරීම.
3. ප්‍රාග්ධනය හවුල් ව්‍යාපාරය තුළ රැඳ වී පැවති කාලය පදනම් ව පොලී ගණනය කිරීම.

**සැ.යු:** විශේෂයෙන් හඳුනාගත නොහැකි විට ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත පොලී ගණනය කරනු ලබයි.

## උදාහරණ - 02

සිරි, ආසිරි සහ ධනසිරි හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධනය සම්බන්ධව තොරතුරු 2017/12/31 න් අවසන් වර්ෂය සඳහා පහත වේ.

| හවුල්කරු | ශේෂය 2017/01/01 | ප්‍රාග්ධනය යෙදවීම 2017/07/01 | ශේෂය 2017/12/31 |
|---|---|---|---|
| සිරි | 300,000 | 100,000 | ------------ |
| ආසිරි | 200,000 | - | ------------ |
| ධනසිරි | 100,000 | 30,000 | ------------ |

ප්‍රාග්ධනය සඳහා වාර්ෂිකව 10% ක පොලී ගෙවනු ලබයි.

i. ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත පොලී ගණනය කරන්න.
ii. අවසන් ප්‍රාග්ධන ශේෂ මත පොලී ගණනය කරන්න.
iii. ප්‍රාග්ධන ශේෂ රඳා පැවති කාලය මත පොලී ගණනය කරන්න.

### හවුල්කරුවන්ගේ වැටුප් ගැලපීම

හවුල්කරුවන් අසමාන ලෙසින් හවුල් ව්‍යාපාරික කටයුතු සඳහා ශ්‍රමය සපයන විට සාධාරණව ලාභ බෙදා හැරීම සඳහා හවුල්කරුවන්ට හවුල් වේතන හෝ වැටුප් ගෙවිය හැක.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

### හවුල්කරුවන්ට වැටුප් හෝ වේතන ගෙවීමේ වැදගත්කම

1. අසමාන ලෙසින් ශ්‍රමයට දායක වන විට සාධාරණව ලාභ බෙදා හැරීම සඳහා,
2. ව්‍යාපාරික ශ්‍රමය සැපයීම සඳහා හවුල්කරුවන් දිරිමත් කළ හැකි වීම.
3. හවුල් ව්‍යාපාරයේ ලාභ නොපැවතිය ද ස්ථිර අදායමක් හවුල්කරුවන්හට හවුල් ව්‍යාපාරයෙන් ලබා දිය හැකි වීම.
4. සිය ශ්‍රමය වෙනත් කටයුත්තක යෙදවීමෙන් ලබා ගත හැකි ආදායම ව්‍යාපාරයෙන් හිමි කර දිය හැකි වීම (ශ්‍රමයේ ආවස්ථික පිරිවැය ලබා දීම)

හවුල්කරුවන්ට ශුද්ධ ලාභයෙන් වාර්ෂිකව වේතන හෝ වැටුප් ප්‍රතිපාදනය කිරීමේ ද්විත්ව සටහන වනුයේ,

**ලාභ අලාභ විසර්ජන ගිණුම හර**

**ජංගම ගිණුම බැර**

හවුල්කරුවන්ට ගිණුම් කාලපරිච්ඡේදය තුළ වැටුප් වේතන මුදලින් ගෙවා තිබිය හැක. මුදලින් ගෙවා ඇති විට ද්විත්ව සටහන වනුයේ,

**ජංගම ගිණුම හර**

**මුදල් පොත බැර**

හවුල් ගිවිසුමෙන් වැටුප් වේතන ලැබීමට හවුල්කරුවන්ට අවසරයක් නොමැති නම් මුදලින් ගත් වැටුප් හෝ වේතන හවුල්කරුවන්ගේ ගැනිලි ලෙස සැලකිය යුතුය.

### ගැනිලි පොලී ගැලපීම

හවුල්කරුවන් හවුල් ව්‍යාපාරයේ සම්පත් පෞද්ගලික ප්‍රයෝජනයට රැගෙන යාම ගැනිලි ලෙස හඳුන්වයි. ගැනිලි ප්‍රධාන කොටස් 02 කි.

1. මුදල් ගැනිලි

   ව්‍යාපාරික මුදල් පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රැගෙන යාම මුදල් ගැනිලි ලෙස හඳුන්වයි. මුදල් ගැනිලි ගැලපීමේ ද්විත්ව සටහන වනුයේ,

   **ජංගම ගිණුම හර**

   **මුදල් බැර**

2. භාණ්ඩ ගැනිලි

   භාණ්ඩ තොග පෞද්ගලික ප්‍රයෝජනයට හවුල්කරුවන් විසින් රැගෙන යාම භාණ්ඩ ගැනිලි ලෙස හඳුන්වයි. භාණ්ඩ ගැනිලි ගැලපීමේ ද්විත්ව සටහන වනුයේ,

   **ජංගම ගිණුම හර**

   **වෙළඳ ගිණුම බැර**

මීට අමතරව හවුල්කරුවෙකුගේ පෞද්ගලිකව භාර ගත යුතු ගෙවීමක් ව්‍යාපාරික මුදලින් ගෙවා ඇති විට ඒවාද ගැනිලි ලෙස හඳුනාගත හැකිය.

**උදා:** හවුල්කරුවන්ගේ ආදායම් බදු හවුල් ව්‍යාපාරයෙන් ගෙවීම.

මෙලෙස සිදු කරනු ලබන සියලු ආකාරයේ ගැනිලි මත පොලියක් ව්‍යාපාරයට අය කර ගැනීම පිළිබඳ කොන්දේසි හවුල් ගිවිසුම් තුළ ඇතුලත් කර ගත හැක.

### ගැනිලි පොලී ගැලපීමේ වැදගත්කම

1. හවුල්කරුවන්ගේ ගැනිලි අධෛර්යමත් කිරීම හා සීමා කිරීම.
2. ගැනිලි සිදු කළ හවුල්කරුවන්ගෙන් අය කරන පොලිය හවුල්කරුවන් අතර නැවත බෙදා හැරීම සිදු වන බැවින් සාධාරණව ලාභ බෙදා හැරිය හැකි වීම.
3. ගැනිලි සිදු කළ සම්පත් වලින් ව්‍යාපාරයට ඉපයිය හැකිව පැවති අහිමි වන ලාභය හවුල්කරුවන්ගෙන් අය කර ගත හැකි වීම (ආවස්ථික පිරිවැය අය වීම)


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

4. හවුල්කරුවන්ට ව්‍යාපාරික ගැනිලි තුළින් ලැබිය හැකි පෞද්ගලික අනිසි ප්‍රතිලාභ ලැබීම වැළක් වීම.

**උදා:** භාණ්ඩ පිරිවැයට ගැනිලි කර ලාභ සහිතව රහසිගතව විකිණීම.

### i. ගැනිලි පොලී ගණනය කිරීම

හවුල්කරුවන් වරින් වර ව්‍යාපාරයෙන් මුදල් ආපසු ගැනීම අධෛර්යමත් කිරීමටත්, එම මුදල් රඳවාගෙන ලාභය වැය කිරීමටත් යොදන උපක්‍රමයකි. ගැනිලි පොලිය, මෙය ගණනය කිරීමට සිදුවන ආකාර කීහිපයකි.

**I ක්‍රමය**

මුදල් ගත් දිනය සඳහන් නොවේ නම් වර්ෂයටම පොලිය ගණනය කිරීම.

**උදාහරණ:** අනිල් රු. 10,000/- ක් ආපසු ගත් බවට වාර්ෂික පොලිය 12% අදාල පොළිය වන්නේ,

**පිළිතුර**

.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

**II ක්‍රමය**

ගැනිලි කළ දිනය සඳහන් වන්නේ නම් එදින සිට මූල්‍ය වර්ෂය අවසන් දිනය දක්වා පොලිය ගණනය කිරීම.

**උදාහරණ:** සුනිල් 2015/04/01 රු. 10,000/- ක් ආපසු ගත් බවත් පොලිය 12% නම් මූල්‍ය වර්ෂය 12/31 අවසන් වන්නේ නම් ගැනිලි පොලිය වන්නේ,

**පිළිතුර**

.....................................................................................................
.....................................................................................................
.....................................................................................................

**III ක්‍රමය**

මූල්‍ය වර්ෂය පුරා නිශ්චිත මුදලක් හැම මාසයක් තුළදීම නිශ්චිත දිනක ආපසු ගෙන ඇති බව සඳහන් වන්නේ නම්,

a) නිශ්චිත මුදලක් සෑම මසක් මුලදී වර්ෂය පුරා ගැනිලි කිරීම.

**උදා:** රුවන් සෑම මසකම 1 වන දින රු. 5,000/- වර්ෂය පුරා ගැනිලි කරයි නම්, ගැනිලි පොලී ගණනය කරන්න.

b) නිශ්චිත මුදලක් සෑම මසක් මැදදීම වර්ෂය පුරා ගැනිලි කිරීම.

**උදා:** කුමුදු, සෑම මසකම 15 වන දින රු. 5,000 ක මුදලක් ගැනිලි කරයි නම්, ඔහුගේ ගැනිලි පොලිය ගණනය කරන්න.

c) නිශ්චිත මුදලක් සෑම මසක් අගදීම වර්ෂය පුරා ගැනිලි කිරීම.

**උදා:** ප්‍රියන්ත සෑම මසකම අවසන් දින රු. 5,000 ක මුදලක් ගැනිලි කරයි නම්, ඔහුගේ ගැනිලි පොලිය කොපමණද?

ඉහත කෙටි ක්‍රමයට ගැනිලි පොලිය ගණනය කිරීම සඳහා පහත සඳහන් සාධක 4 ස්ථාවරව පැවතිය යුතුයි.

i. වර්ෂය තුළ මාස 12 සඳහාම ගැනිලි කර තිබිය යුතුය.

ii. හැම මාසයකම ගැනිලි කළ දිනය වෙනස් නොවිය යුතුයි.

iii. මාසිකව ගත් මුදල වෙනස් නොවිය යුතුයි.

iv. ගැනිලි පොලී අනුපාතිකය වර්ෂය පුරා නොවෙනස්ව තිබිය යුතුයි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

**ii. ගැනිලි පොලී සඳහා ගිණුම් තැබීම**

ගැනිලි පොලී අය කිරීමේ ද්විත්ව සටහන වනුයේ,

**ජංගම ගිණුම හර**

**ලාභ අලාභ විසර්ජන ගිණුම බැර**

## උදාහරණ - 03

අමල්, කමල්, නිමල් හවුල් ව්‍යාපාරයේ 2017/03/31 න් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

1. ලාභ අලාභ අමල්, කමල්, නිමල් අතර පිළිවෙලින් 5 : 3 : 2 වේ.
2. ප්‍රාග්ධනය සඳහා 10% ක වාර්ෂිකව පොලී ගෙවනු ලබයි.
3. වේතන අමල් 3,000 ක් ද, කමල් හා නිමල් 2,000 බැගින්ද මාසිකව ගෙවනු ලැබේ.
4. 2017 වර්ෂයේ ශුද්ධ ලාභය 180,000 කි.
5. හවුල්කරුවන්ගේ වේතන වලින් මාස 06 වේතනවල හවුල්කරුවෙකු වෙනුවෙන්ම 03/31 ට උපචිතව පවතී.
6. හවුල්කරුවන්ගේ 2016/04/01 දිනට ප්‍රාග්ධන ශේෂ සහ වාර්ෂික ගැනිලි පහත වේ.

| | ප්‍රාග්ධනය | ගැනිලි |
|---|---|---|
| අමල් | 300,000 | 40,000 |
| කමල් | 200,000 | 20,000 |
| නිමල් | 180,000 | 10,000 |

- ඉහත තොරතුරු ලාභ අලාභ විසර්ජන ගිණුමක හා ජංගම ගිණුමක සටහන් කර පෙන්වන්න.

## උදාහරණ - 04

ඔස්ටින් හා මොරිස් වෙළඳ ව්‍යාපාරයක හවුල්කරුවෝය. හවුල් ගිවිසුමෙ කොන්දේසි කීපයක් මෙසේය.

i. ලාභලාභ අනුපාත පිලිවෙලින් 7 : 3
ii. ස්ථාවර ප්‍රාග්ධනය මත පොලි අනුපාතිකය 5%
iii. ආරම්භක ජංගම ගිණුම් සඳහා ගැලපිය යුතු පොලිය 10%
iv. ගැනිලි වල වාර්ෂික වටිනාකම රු. 10,000 ඉක්මවන්නේ නම් අතිරික්තය මත පොලිය 4%
v. වේතන ඔස්ටින් මාසිකව රු. 1,000/- මොරිස් කාර්තුවක් 5,000/-

2017/03/31 දිනට ලාභලාභ ගිණුම පිළියෙළ කළ පසු උපුටාගත් අයිතමයන්

| ශුද්ධ ලාභය | | | 200,000 |
|---|---|---|---|
| **ජංගම ගිණුම 2016/04/01** | ඔස්ටින් | | 10,000 |
| | මොරිස් | | 15,000 |
| | | | |
| **ප්‍රාග්ධන ගිණුම් 2016/04/01** | ඔස්ටින් | | 18,000 |
| | මොරිස් | | 20,000 |
| | | | |
| **ගැනිලි** | ඔස්ටින් | 30,000 | |
| | මොරිස් | 40,000 | |

පොදු සංචිතයට රු. 15,000/- ක් මාරු කිරීමෙන් අනතුරුව ලා/ලා විසර්ජන, ජංගම ගිණුම් ලියා පෙන්වන්න.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## උදාහරණ - 05

සුමුදු සහ කුමුදු හවුල්කරුවෝ ඔවුන්ගේ ප්‍රාග්ධනය සඳහ 10% ක පොලියක්ද, වර්ෂිකව පිළිවෙලින් රු. 8,000 හා රු. 7,000/- ක වේතන ද ලබා ගනිමින් වර්ෂය සඳහා 3 : 2 අනුපාතයට ලා/ලා බෙදාගෙන ඇත.

හවුල්කරුවන්ගේ ආරම්භක ප්‍රාග්ධන ශේෂයන් පිළිවෙලින් රුපියල් 200,000 හා රු. 100,000 බව සලකන්න. සුමුදු ලද ලාභ කොටස් රු. 24,000 කි.

මෙම ව්‍යාපාරයේ ප්‍රථම වර්ෂය බව සලකා ගිණුම්වල ගැලපීම් සඳහා අවශ්‍ය ජ'නල් සටහන්ද, ලා/ලා විසර්ජන ගිණුම හා ජංගම ගිණුම් ද පිළියෙල කරන්න.

## ශුද්ධ ලාභ අලාභ බෙදා හැරීම

තනි ව්‍යාපාරයක ගිණුම් කාලපරිඡේදයක් තුළ උපයන ලද ලාභය අයිතිකරු සතු වේ. එහෙත් හවුල් ව්‍යාපාරයක උපයන ලද ශුද්ධ ලාභය සියලුම හවුල්කරුවන් සතුය. එබැවින් ගිණුම් කාලපරිච්ඡේදයක ශුද්ධ ලාභය සියලු හවුල්කරුවන් අතර බෙදා හැරීමක් (විසර්ජනයක්) සිදු කිරීම අවශ්‍ය වේ. එම අවශ්‍යතාවය ඉටු කිරීම සඳහා හවුල් ව්‍යාපාර ලාභ අලාභ විසර්ජන ගිණුමක් පිළියෙල කරයි. එබැවින් තනි ව්‍යාපාර මෙන් වෙළඳ හා ලාභ අලාභ ගිණුම වෙනුවට වෙළඳ ලාභ අලාභ හා ඊට අමතරව ලාභ අලාභ විසර්ජන ගිණුම නමින් ගිණුමක් පිළියෙල කරයි.

### ලාභ අලාභ විසර්ජන ගිණුම (Profit) Loss Appropriation Account)

කිසියම් ගිණුම් කාලපරිච්ඡේදයක් තුළ ඉපයු ලාභය හවුල් ගිවිසුමට අනුව හෝ හවුල් ආඥා පනතට අනුව හවුල්කරුවන් අතර බෙදා හැරීම සඳහා පිළියෙල කරනු ලබන ගිණුම ලාභ අලාභ විසර්ජන ගිණුම ලෙස හඳුන්වයි.

ඉපයු ලාභය ලාභ කොටස් ලෙස පමණක් නොව ලාභ බෙදා හැරීම සඳහා පහත කරුණ අවධාරණයට ලක් කර බෙදා හරිනු ලබයි.

### හවුල් ව්‍යාපාර ගිණුම් වලදී ගිණුම් අයිතම ලාභ අලාභ ගිණුම හා ලාභ අලාභ විසර්ජන ගිණුම අතර වෙන් කොට දැක්වීම.

හවුල් ව්‍යාපාර ගිණුම්වලදී හවුල්කරුවන් සම්බන්ධ ගිණුම් අයිතම ලාභ අලාභ ගිණුමට ගලපනවා ද නොඑසේ නම් ලාභ අලාභ විසර්ජන ගිණුමට ගලපනවා දැයි තෝරා ගැනීමට සිදු වේ. පහත කරුණ මත පදනම්ව එය සිදු කරනු ලබයි.

### හවුල්කරුවා අදාල හිමිකම ලැබීම සඳහා ක්‍රියාකළ ආකාරය

හවුල්කරුවන් හවුල් ව්‍යාපාර කටයුතු වලට හවුල්කරුවෙකු ලෙස මෙන්ම බාහිර පාර්ශව ලෙස මැදිහත් වීම් ලෙස අවස්ථා දෙකක් හඳුනාගත හැක.

එහිදී හවුල්කරු,

- හවුල්කරුවෙකු ලෙස මැදිහත් වී නම් ලාභ අලාභ විසර්ජන ගිණුමට ද,
- බාහිර පාර්ශවයක් ලෙස මැදිහත් වී නම් ලාභ අලාභ ගිණුමටද ගැලපිය යුතුය.

## උදාහරණ - 06

පහත සඳහන් අයිතම වාර්තා කළ යුත්තේ ලාභ අලාභ ගිණුමටද නැතිනම් ලාභ අලාභ විසර්ජන ගිණුමට ද යන්න දක්වන්න.

1. ප්‍රාග්ධනය මත පොලී
2. හවුල්කරුවන්ගේ ණය ගිණුමට ගෙවූ පොලී
3. හවුල්කරුවන්ගේ හවුල් වේතන
4. හවුල් ව්‍යාපාර කාර්යාලය හවුල්කරුවෙකුගේ නිවසක පැවැත්වීම වෙනුවෙන් ඔහුට ගෙවන කුලිය.
5. ගණකාධිකාරී ලෙස සේවය කරන හවුල්කරුගේ වැටුප
6. ඉවත් වූ හවුල්කරුවෙකුගේ මුදලයට ගෙවන මුදල් පොලී


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

7. හවුල්කරුවෙකුගේ බිරිඳ ව්‍යාපාරයට සපයා ඇති ණය සඳහා ගෙවන පොලිය
8. ලාභ වලින් සංචිත වලට මාරු කිරීම්
9. ජංගම ගිණුම් පොලී
10. ගැනිලි මත අය කළ පොලී
11. විකුණුම් කළමනාකරු වන හවුල්කරුවෙකුට විකුණුම් මත ගෙවන 5% ක කොමිස් මුදල
12. නිෂ්පාදන කළමනාකරු ලෙස සේවය කරන හවුල්කරුවෙකුට ගෙවන වැටුප

**විශේෂිත ක්‍රියාකාරකම් මගින් හවුල්කරුවන් උපයන දෑ**

**(විසර්ජනයන් නොවන කාර්යයන් මගින් උපයන දෑ)**

ලාභ විසර්ජනය කිරීමක් තුලින් යම් ප්‍රතිලාභයක් හවුල්කරුවන් වෙත ලබාදෙන්නේ නම් හෝ ව්‍යාපාරය යටතේ අයකරගනු ලබන්නේ නම් ඒවා විසර්ජන ගිණුමේ සටහන් කලයුතු බව මතක තබා ගත යුතුය.

එහෙත් ලාභ බෙදීමක් ලෙස නොසලකෙන විශේෂිත ක්‍රියාකාරකමක් යම් හවුල්කරුවෙකු විසින් සිදුකර ඇති විටෙක ඒ සඳහා ඔහුට ලබාදෙන ප්‍රතිලාභය ලාභලාභ ගිණුමේ සටහන් කොට ලබාදිය යුතුය. ඒවා පහත පරිදිය.

1. ගණකාධිකරණ වැටුප් (ඉහත සාකච්ඡා කර ඇත)
2. විකුණුම් කොමිස් (ඉහත සාකච්ඡා කර ඇත)
3. ප්‍රාග්ධනයට අමතරව සපයා ඇති ණය සඳහා පොළි
4. හවුල්කරුවෙකුගෙන් ලබාගත් ගොඩනැගිල්ලක් සඳහා ගෙවන කුළී

ඉහත සියළු දෑ සටහන් කිරීමට අදාල ද්විත්ව සටහන වන්නේ,

**ලාභලාභ ගිණුම හර**

**ජංගම ගිණුම බැර**

**විසර්ජන ගිණුමක් මගින් ලාභය බෙදා හැරීම**

**24 වන වගන්තිය අනුව නම්,**

හවුල්කරුවන් අතරේ ලාභඅලාභ සමසමව බෙදාහැරිය යුතු අතර, එය ලාභ අලාභ කොටස් ලෙස හඳුන්වයි.

**ලිඛිත හවුල් ගිවිසුම අනුව නම්,**

හවුල්කරුවන් විසින් ව්‍යාපාරයට දක්වා ඇති දායකත්වයන් අනුව හවුල් ගිවිසුමෙන් එකඟවී ඇති පරිදී විවිධාකාරී ලෙස ලාභය බෙදාහැරීම සිදු කෙරෙන අතර එලෙස ලාභ බෙදාහැරීමේදී පහත පිළිබඳ අවධානය යොමු කල යුතුය.

1. සංචිත වලට මාරු කිරීම

**ලාභාලාභ විසර්ජන ගිණුම හර**

**සංචිත ගිණුම බැර**

2. ප්‍රාග්ධන පොලී ලැබීම

ලාභලාභ අනුපාතයට අසමාන ලෙසින් ප්‍රාග්ධනය යොදා ඇති විටකදී අසාධාරණ ලෙස ලාභ බෙදිම වැලක්වීම මෙහි අරමුණයි.

**ලාභලාභ විසර්ජන ගිණුම හර**

**ජංගම ගිණුම බැර**

3. හවුල් වේතන / වැටුප් ලබා දීම

ලාභලාභ අනුපාතයට නොගැලපෙන ලෙස ශ්‍රමය / කළමනාකරණ හැකියාව ලබාදෙන විටකදී අසාධාරණ ලෙස ලාභ බෙදීම වැලක්වීම මෙහි අරමුණයි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

**ලාභාලාභ විසර්ජන ගිණුම හර**

**ජංගම ගිණුම බැර**

4. ශුද්ධ ලාභයෙන් කොමිස් ලබා දීම

හවුල්කරුවන් විසින් ව්‍යාපාරයේ ලාභදායිත්වය ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම හේතුවෙන් ඒ සඳහා සෘජු ලෙස දායක වන හවුල්කතරුවන්ට අනෙක් හවුල්කරුවන්ගේ එකඟත්වයෙන් යම් කොමිස් මුදලක් ශුද්ධ ලාභයෙන් ලබාදී ඔවුන් තවදුරටත් ධෛර්යමත් කිරීම මෙහි අරමුණයි.

**ලාභාලාභ විසර්ජන ගිණුම හර**

**ජංගම ගිණුම බැර**

### ගැනිලි පොලී

හවුල්කරුවන් දිගින් දිගටම ගැනිලි කිරීමෙන් ව්‍යාපාරයට මුල්‍ය දුෂ්කරතා වලට මුහුණ දිමට සිදුවිය හැකිය. මේ නිසා ගැනිලි සඳහා සීමාවක් ඇති කිරීම ප්‍රායෝගිකව සිදුවේ. නමුත් ඇතැම්විට එම සීමාව ඉක්මවීම ඇතැම් හවුල්කරුවන් සිදුකරන විටකදී ඔවුන්ගේ එම කාර්යය අධෛර්යමත් කිරීම සඳහා පොළියක් අයකරගෙන එය සියළු හවුල්කරුවන් වෙත නැවත බෙදාහරිනු ලබයි. එය ලාභ විසර්ජනයක් වන අතර පහත පරිදි සටහන් කෙරේ.

**ජංගම ගිණුම හර**

**ලාභලාභ විසර්ජන ගිණුම බැර**

### ජංගම ගිණුම් සඳහා පොලී

හවුල්කරුවන්ගේ කෙටිකාලින විචල්‍ය හිමිකම නිරුපණය වන්නේ ජංගම ගිණුම තුලය. හවුල්කරුවන් තමාගේ විචල්‍ය හිමිකම ව්‍යාපාරය තුළ රඳවා ඇත්නම් එය ජංගම ගිණුමේ බැර ශේෂයක් ලෙස නිරූපණය වේ. එවිට ඒ සඳහා ඔවුන්ට පොළියක් ලබාදීමට හැකිය.

එවිට ද්විත්ව සටහන වන්නේ,

**ලාභලාභ විසර්ජන ගිණුම හර**

**බැර ශේෂ සහිත හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් බැර**

ජංගම ගිණුමක හර ශේෂයක් පවතීනම් එයින් නිරූපණය වන්නේ හවුල්කරුවන් තම විචල්‍ය හිමිකම් ප්‍රමාණය ඉක්මවා ඉවත්කරවාගෙන ඇති ප්‍රමාණයයි. එම මුදල පියවන තෙක් ඔවුන්ගෙන් පොළියක් අයකර එය සියළු හවුල්කරුවන්ට බෙදාදීම කල හැකිය. එවිට ද්විත්ව සටහන වන්නේ,

**හර ශේෂ සහිත හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් හර**

**ලාභලාභ විසර්ජන ගිණුම බැර**

### ලාභ අළාභ කොටස

හවුල් ගිවිසුමෙන් එකඟවී ඇති පරිදී ලාභය බෙදාහැරීම කල පසු තවත් ලාභ අලාභ ඉතිරී වී ඇත්නම් හවුල්කරුවන් විසින් එකගවී ඇති ලාභලාභ අනුපාතය අනුව බෙදාදිය හැකිය. ඒවා ලාභාලාභ කොටස් ලෙස හදුන්වයි.

ලාභ කොටස නම්, අලාභ කොටස නම්,

……………………………………………. …………………………………………….

ව්‍යාපාරයේ විකුණුම් පදනම් කරගෙන කොමිස් ගෙවන්නේ නම් එය ලාභ විසර්ජනයටක් ලෙස නොසැලකිය යුතු අතර එය ගණනය කිරීම සඳහා ලාභලාභ ගිණුමේ බෙදාහැරීමේ වියදම් වල ඇතුලත් කල යුතුය.

ලාභ අලාභ විසර්ජන ගිණුම් ආකෘතිය (A B සහ C හවුල් ව්‍යාපාරය යැයි සිතමු.)


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## සිරස් ක්‍රමයට ලාභ අලාභ විසර්ජන ගිණුම

**A B සහ C හවුල් ව්‍යාපාරය**
**............ න් අවසන් ත්වත්වත්වත්ව සඳහා**
**ලාභ අලාභ විසර්ජන ගිණුම**

| | | | |
|---|---|---|---|
| ශුද්ධ ලාභය / අලාභය | | | xxx |
| + ගැනිලි පොළී | | | |
| | A | xxx | |
| | B | xxx | |
| | C | xxx | xxx |
| | | | xxx |
| (-) ප්‍රාග්ධන පොලී | | | |
| | A | xxx | |
| | B | xxx | |
| | C | xxx | (xxx) |
| වේතන | | | |
| | A | xxx | |
| | B | xxx | |
| | C | xxx | (xxx) |
| සංචිත වලට මාරු කිරීම් | | | (xxx) |
| ලාභ කොටස් | | | |
| | p | xxx | |
| | B | xxx | |
| | C | xxx | xxx |
| | | | xxx |

## උදාහරණ - 07

A,B,C හවුල් ව්‍යාපාරයේ 2017.03.31 න් අවසන් වර්ෂයේ ගිණුම් ශේෂ කිහිපයක් පහත වේ.

| | රු. |
|---|---|
| <u>ප්‍රාග්ධන ගිණුම්</u> | |
| • A බැර | 200,000 |
| • B බැර | 150,000 |
| • C බැර | 100,000 |
| <u>ජංගම ගිණුම්</u> | |
| • A බැර | 10,000 |
| • B බැර | 4,000 |
| • C හර | 3,000 |

- 2017.06.30, A හවුල් ව්‍යාපාරික වෙනුවෙන් රු. 25,000 ක මුදලක් ණය ලෙස රැගෙන එන ලදී.
- හවුල් ව්‍යාපාරයේ වූ ගිවිසුමේ කොන්දේසි වලට අනුව,
  - ප්‍රාග්ධනය සඳහා පොලිය වාර්ෂිකව 6% දක්වා වැඩි කිරීම.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

- හවුල් වේතන ලෙස-මාසිකව
    - A රු. 25,000
    - B රු. 20,000
    - C රු. 15,000

- හවුල්කරුවෙකු සපයන ණය සඳහා 10% වාර්ෂික පොලියක් ගෙවීම.
- හවුල්කරුවන් ලාභලාභ පිළිවෙලින් 5 : 3 : 2 අනුව බෙදා ගැනීමට එකඟ වී ඇත.
    - පොදු සංචිතයට රු 25,000 ක් මාරු කිරීම.
    - 2017.03.31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු.198,036 කි.

1. 2017.03.31 න් අවසන් වර්ෂය සඳහා ලාභලාභ විසර්ජන ගිණුම (ලකුණු 04)
2. 2017.03.31 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (ලකුණු 03)
3. 2017.03.31 දිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් (ලකුණු 03)

## හවුල් ව්‍යාපාරයක ලාභ සහ ආදායම සහතික වීම

**ලාභ/ආදායම සහතික වීම**

- ලාභ සහතික වීම
    - අවම ලාභයක් සහතික වීම
    - උපරිම ලාභයක් සහතික වීම
- ආදායම් සහතික වීම
    - අවම ආදායමක් සහතික වීම
    - උපරිම ආදායමක් සහතික වීම

- හවුල්කරුවන්ගේ ලාභ කොටස - ලාභලාභ විසර්ජන ගිණුම තුලින් ප්‍රාග්ධන පොළී, හවුල් වේතන, හවුල් කොමිස් යනාදී වශයෙන් ලාභ විසර්ජනය කොට තවදුරටත් විසර්ජනයට ඉතිරි ලාභය මින් අදහස් කරයි.
- හවුල්කරුවකුගේ ආදායම

| | |
|---|---|
| ප්‍රාග්ධන පොළී | XXX |
| හවුල් වේතන | XXX |
| හවුල් කොමිස් | XXX |
| හවුල් ලාභ කොටස | XXX |
| | XXX |
| **අඩු කලා:** | |
| ගැනිලි පොළී | (XX) |
| අලාභ කොටස් | (XX) |
| හවුල්කරුවකුගේ ආදායම | XXX |

### අවම ''ආදායම සහ ලාභය'' සහතික කිරීම

හවුල්කරුවකුට හිමිවිය යුතු අවම ලාභ කොටස හෝ ආදායම මෙහිදී තවත් හවුල්කරුවකු හෝ හවුල්කරුවන් කිහිප දෙනෙකු සහතික වේ.

JMC vLearning your virtual learning partner

## උදාහරණ - 08

අමල්, බිමල්, කමල් 2 : 3 : 5 අනුපාතයට ලා/ලා බෙදා ගන්නා හවුල්කරුවෝය.

2016/04/01 දිනට හිමිකම් ගිණුම්වල ශේෂය

| | ප්‍රාග්ධන | ජංගම |
|---|---|---|
| අමල් | 100,000 | 6,000 |
| බිමල් | 200,000 | (3,000) |
| කමල් | 300,000 | 5,000 |

හවුල් ගිවිසුමේ උපුටා ගැනීම

1. ප්‍රාග්ධන පොලිය වර්ෂයකට 10%
2. වාර්ෂික වේතන රු. 5,000, රු. 10,000, රු. 15,000

2017/03/31 අවසන් වර්ෂයේ විසර්ජනය කළ හැකි ශුද්ධ ලාභය රු. 140,000

පහත සඳහන් එකිනෙක සහතික කිරීමට යෝග්‍ය වන ප්'නල සටහන් හා ජංගම ගිණුම් පිළියෙල කරන්න.

i. කමල්ගේ ලාභ කොටස රු. 35,000/- ට අඩු නොවන බවට බිමල් සහතික වී ඇත්නම්,

ii. කමල්ගේ ලාභ කොටස රු. 40,000/- ට අඩු නොවන බවට අමල් සහ බිමල් සහතික වී ඇත්නම්,

iii. කමල්ගේ වාර්ෂික ආදායම රුපියල් 75,000/- ට අඩු නොවන බවට අමල් සහතික වී ඇත්නම්,

iv. කමල්ගේ වාර්ෂික ආදායම රු. 90,000/- ට අඩු නොවන බවට අවශේෂ හවුල්කරුවන් සහතික වී ඇත්නම්,

### උපරිම ආදායම සහ ලාභය සහතික කිරීම

මෙම කොන්දේසිය නිසා යම්කිසි හවුල්කරුවකුගේ ආදායමේ හෝ ලාභයේ උපරිම සීමාවන් පැනවීම සිදු නොවේ. මෙහි අදහස යම්කිසි හවුල්කරුවෙකුගේ උපරිම ලාභය/ ආදායම පිළිබඳ යම් නිශ්චිත හවුල්කරුවෙක් තවත් හවුල්කරුවෙකුට සහතික වීමයි. එවිට අදාල හවුල්කරුගේ ලාභය / ආදායම උපරිමය ඉක්මවා ගියහොත් එමනිසා අනෙකුත් හවුල්කරුවන්ට සිදුවන පාඩුව / අවාසිය සහතික වූ හවුල්කරු විසින් අනෙක් හවුල්කරුට ගෙවිය යුතුය.

## උදාහරණ - 09

3 : 2 : 1 අනුපාතයට ලා/ලා බෙදා ගන්නා සුමුදු, කුමුදු, දිමුතු, හවුල් ව්‍යාපාරයේ වාර්ෂික විසර්ජනය කළ හැකි ශුද්ධ ලාභය රු. 90,000 කි. දිමුතුගේ උපරිම ලාභ කොටස රු. 10,000/- ක් බවට සුමුදු කුමුදුට සහතික වී ඇත. අවශ්‍ය ගැලපීම් කිරීමට අදාල ප්'නල් සටහන් දක්වන්න

## උදාහරණ - 10

ඕලු, නෙළුම්, මානෙල් හවුලේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ 2016/04/01 දිනට මෙසේය.

| | |
|---|---|
| ඕලු | 60,000 |
| නෙළුම් | 90,000 |
| මානෙල් | 150,000 |

හවුල් ගිවිසුමේ කොන්දේසි,

1. වාර්ෂික ප්‍රාග්ධන පොලී 12%
2. මාසික වේතන පිළිවෙලින් රු. 500/-, රු. 1,000/- රු. 1,500/-
3. ලා/ලා අනුපාතය 5 : 3 : 2

විසර්ජනය කළ හැකි ශුද්ධ ලාභය රු. 94,000/-


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ඕලුගේ උපරිම ලාභ කොටස රු. 12,000 ක් බවට මානෙල් නෙළුම්ට සහතික වී ඇත.

ඔබ විසින්,

i. 2017/3/31 අවසන් වර්ෂය සඳහා ලාභලාභ විසර්ජණ ගිණුම පිළියෙල කරන්න.

ii. එදිනට හවුල්කරුවන්ගේ ජංගම ගිණුම පිළියෙල කරන්න.

## උදාහරණ - 11

ලාල් සහ නිහාල් සමානව ලා/ලා ලබන හවුල්කරුවෝය. සේවකයෙකු වන සපුමල් ලාභයෙන් 1/4 ක් සඳහා හවුල්කරුවකු ලෙස බඳවා ගන්නා ලදී.

සේවකයෙක් ලෙස සපුමල් ලැබූ වාර්ෂික වේතනය රු. 10,000/- ක් වන අතර වේතන හා කොමිස් අඩුකළ ශුද්ධ ලාභයෙන් 4% ක කොමිස් මුදලක් ද ඔහු ලැබීය.

සපුමල් සේවකයෙකු ලෙස ලද ආදායමට වඩා අඩු ලාභ කොටසක් නොලබන බවට ලාල් සහතික කරන ලදී. සපුමල් හවුල්කරුවකු වූ ප්‍රථම වසරේ ශුද්ධ ලාභය රු. 36,000/- හවුල්කරුවන් අතර මෙම ලාභය බෙදී යා යුත්තේ කෙසේද? හවුල්කරුවකු වූ පසු සපුමල්ට වේතන, කොමිස් නොලැබේ.

## උදාහරණ - 12

මනෝ, සනී සහ සිරි හවුල් ඔප්පුවේ තොරතුරු,

1. ලාභලාභ අනුපාතය 3 : 2 : 1
2. ගැනිලි සඳහා වාර්ෂික පොලිය 6%
3. වර්ෂය මුල ප්‍රාග්ධනය ශේෂයට පොලිය 6%
4. සිරිගේ වාර්ෂික වේතන රු. 5,000
5. සිරිගේ වාර්ෂික අවම ආදායම රු. 20,000 ක් විය යුතු අතර ඌණතාවය සඳහා මනෝ සහතික වී ඇත.

<u>2017/03/31 අවසන් වර්ෂයේ තොරතුරු:</u>

i. සෑම මසකම පළමු දින මනෝ, 15 දින සනී සහ අවසන් දින සිරි රු. 1,000/- බැගින් ආපසු ගෙන ඇත.

ii. මනෝගේ ගොඩනැගිල්ලක් වාර්ෂික කුලිය 3,600 කට හවුලට දී ඇත.

iii. 2016/04/01 ප්‍රාග්ධන ශේෂයන්

| | | |
|---|---|---|
| මනෝ 30,000 | සනී 25,000 | සිරි 15,000 |

iv. වේතන හෝ බදු කුලී මුදලින් ගෙවා නැත.

v. සිරිගේ වේතන ලාභලාභ ගිණුමට හර කොට මනෝගේ බදු කුලිය අය කිරීමට පෙර වාර්ෂික ශුද්ධ ලාභය 46,520.

a) නිවැරදි ශුද්ධ ලාභය ගණනය කරන්න.

b) ලාභලාභ විසර්ජන සහ ජංගම ගිණුම පෙන්වන්න.

# හවුල් ව්‍යාපාර අවසන් ගිණුම පිළියෙල කිරීම

## සංයුතියේ වෙනසක් රහිත හවුල් ව්‍යාපාරවල අවසන් ගිණුම් පිළියෙල කිරීම

## උදාහරණ - 13

නිමල්, සුනිල් සහ රොහාන් හවුල්කරුවන් වශයෙන් සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් පවත්වා ගෙන ගියහ. හවුල් ගිවිසුම අනුව පහත සඳහන් කොන්දේසි අදාල වේ.

1. එක් එක් වර්ෂය අවසානයේ හවුල්කරුවන්ට පහත සඳහන් පරිදි වේතන බැර කරනු ලැබේ. එනම්, නිමල්ට රු. 10,000 ක් සහ රොහාන්ට රු. 5,000 බැගින් වූ වේතන ප්‍රමාණයන්ය. එසේම

JMC vLearning your virtual learning partner


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

හවුල්කරුවන්ගේ වර්ෂය ආරම්භයේ තිබුණු ප්‍රාග්ධන ශේෂයන්ට 5% ක වාර්ෂික පොළියක් ද බැර කරනු ලැබේ.

2. ගැනිලි සඳහා පොළියක් අය කරනු නොලැබේ.

3. ප්‍රාග්ධනය සඳහා පොළී සහ හවුල්කරුවන්ගේ වේතන අයකිරීමෙන් පසු ලාභලාභ පහත සඳහන් අනුපාතය බෙදාගත යුතුය. නිමල් 50%, සුනිල් 30%, රොහාන් 20% වශයෙනි. තවද කිසියම් වර්ෂයක රොහාන්ගේ ලාභ කොටස (එනම්, වේතනය සහ පොලිය ඇතුලත් නොකර) රු. 10,000 මට්ටමට අඩු නොවිය යුතුය. මෙම ප්‍රමාණය කිසියම් ආකාරයකින් අඩු වුවහොත් එම හිඟය අනෙක් හවුල්කරුවන් දෙදෙනා විසින් ලාභ බෙදා ගන්නා අනුපාතයට අනුව බෙදාගත යුතු වේ.

2016/12/31 දින අවසාන වර්ෂයේ ශේෂ පරීක්ෂණය පහත සඳහන් වේ.

| | හර රු. | බැර රු. |
|---|---|---|
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් ජනවාරි 01 ශේෂ | | |
| නිමල් | | 80,000 |
| සුනිල් | | 50,000 |
| රොහාන් | | 30,000 |
| හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් ජනවාරි 01 ශේෂ | | |
| නිමල් | | 16,000 |
| සුනිල් | | 12,000 |
| රොහාන් | | 8,000 |
| විකුණුම් | | 465,000 |
| ණයහිමියෝ | | 37,000 |
| සාප්පු සවිකිරීම් - පිරිවැයට | 36,000 | |
| සාප්පු සවිකිරීම් ක්ෂය වෙන්කිරීම ජනවාරි - 01 | | 14,000 |
| සින්නක්කරගේ දොර ඉඩකඩම් - පිරිවැයට | 60,000 | |
| බද්දට ගත් ගේ දොර ඉඩකඩම් - වර්ෂය තුළ ගන්නා ලද | 45,000 | |
| බද්දට ගත් ගේ දොර ඉඩකඩම් - එකතු කිරීම් සහ වෙනස් කිරීම් | 25,000 | |
| ගැණුම් | 280,000 | |
| අත ඉතිරි තොගය ජනවාරි 01 දිනට | 42,000 | |
| වැටුප් හා වේතන | 64,000 | |
| කාර්යාල සහ වෙළඳ වියදම් | 45,200 | |
| බදු කුලී වරිපනම් සහ රක්ෂණ | 10,500 | |
| වෘත්තීමය ගාස්තු | 3,500 | |
| ණයගැතියෝ | 20,600 | |
| අඩමාණ ණය සඳහා වෙන් කිරීම ජනවාරි 01 | | 500 |
| බැංකුවේ ශේෂය | 43,700 | |
| ගැනිලි මාසිකව ගෙවීම් හැර : නිමල් | 17,000 | |
| සුනිල් | 11,000 | |
| රොහාන් | 9,000 | |
| | 712,500 | 712,500 |

ඔබට පහත සඳහන් අතිරේක තොරතුරු සපයා ඇත.

i. දෙසැම්බර් 31 දිනට වෙළඳ භාණ්ඩ තොගයේ වටිනාකම රු. 36,000 කි.

ii. රු. 600 ක ණයක් කපා හැරිය යුතු වන අතර, ඉතිරි ණයගැතියන් සඳහා 5% ක වෙන් කිරීමක් කළ යුතුය.

iii. වැටුප් සහ වේතනවලල හවුල්කරුවන් විසින් පහත සඳහන් පරිදි මාස්පතා ලබාගත් ගැනිලි අඩංගු වේ.

නිමල් රු. 500 සුනිල් රු. 300 රොහාන් රු. 250

iv. වර්ෂය තුළ හවුල්කරුවන්ට පහත සඳහන් පරිදි භාණ්ඩ සපයා ඇත.

JMC vLearning "your virtual learning partner"

නිමල් රු. 600 සුනිල් රු. 400

v. දෙසැම්බර් 31 වෙනි දිනට කලින් ගෙවන ලද වරිපනම් සහ ගෙවිය යුතුව ඇති කාර්යාල සහ වෙළඳ වියදම් පිළිවෙලින් රු. 2,500 සහ රු. 2,400 කි.

vi. සාප්පු සවිකිරීම් සඳහා වර්ෂයක 5% බැගින් පිරිවැය මත ක්ෂය කිරීම් කළ යුතුය.

vii. සින්නක්කර ගේ දොර මිලදී ගැනීමේදී ගෙවන ලද රු. 2,500 ක ගාස්තු වෘත්තීමය ගාස්තුවල ඇතුලත් ය. මෙම ගාස්තුව ප්‍රාග්ධනික කළ යුතු වේ.

viii. බද්දට ගත් ගේ දොරට එකතු කිරීම් සහ වෙනස් කිරීම් සඳහා කළ පිරිවැය වර්ෂ 25 ක් තුල ලියාහැරිය යුතු අතර, එම ලියාහැරීම කළ යුත්තේ, එම බදු දේපල මිලදී ගත් වර්ෂයේ ජනවාරි 01 දින සිටය.

පහත සඳහන් දේ පිළියෙළ කරන්න.

1. 2016 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුම
2. 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය
3. 2016 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් තීරු ක්‍රමයට

## උදාහරණ - 14

අජිත්, මලිත්, ශිහාන් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ සඳහන් වන්නේ,

1. ලාභාලාභ 5 : 3 : 2 අනුපාතයට අජිත්, මලිත්, ශිහාන් අතර බෙදිය යුතුයි.
2. ප්‍රාග්ධන ගිණුම් සඳහා 10% පොලී වෙන්කළ යුතුයි.
3. ගැනිලි වෙනුවෙන් 6% ක පොලී අයකළ යුතුයි.
4. අජිත්ට මාසයකට රු. 2,000 ක් හා මලිත්ට මාසයකට රු. 1,000 ක වේතන වෙන් කළ යුතුයි.
5. මලිත්ගේ නිවාසයක් ව්‍යාපාර ස්ථානයට භාවිතා කිරීම වෙනුවෙන් මාසයකට රු. 3,000 ක කුලියක් ගෙවිය යුතුයි.

- මලිත් වරලත් ගණකාධිකාරීවරයෙකු හෙයින් ඔහු ව්‍යාපාරයේ ගිණුම් කටයුතුවලට සම්බන්ධ වීම වෙනුවෙන් වර්ෂයකට රු. 15,000 ක ගෙවීමක් වෙන් කළ යුතුයි. 2016.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් තැබීමෙන් අනතුරුව ලබා ගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | | |
| - අජිත් | | 200,000 |
| - මලිත් | | 200,000 |
| - ශිහාන් | | 100,000 |
| ජංගම ගිණුම් (2015.01.01) | | |
| - අජිත් | 4,000 | |
| - මලිත් | - | 20,000 |
| - ශිහාන් | 10,000 | |
| ගැනිලි | | |
| - අජිත් | 12,000 | |
| - මලිත් | 6,000 | |
| - ශිහාන් | 6,000 | |
| ගැණුම් / විකුණුම් | 250,000 | 870,000 |
| මොටර් රථ (පිරිවැයට) | 520,000 | |
| ලිබඩු (පිරිවැයට) | 100,000 | |
| ක්ෂය වෙන් කිරීම් (2016.12.31) | | |
| - මොටර් රථ | | 60,000 |
| - ලිබඩු | | 25,000 |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | |
|---|---|---|
| තොගය (2016.01.01) | 42,000 | |
| ආයාත බදු | 35,000 | |
| ණයගැතියෝ / ණයහිමියෝ | 150,000 | 80,000 |
| වේතන | 40,000 | |
| විදුලිය | 16,000 | |
| ප්‍රචාරණය | 32,000 | |
| ලිපිද්‍රව්‍ය | 11,000 | |
| අවිනිශ්චිත ගිණුම | | 15,000 |
| ලැබිය යුතු බිල් | 40,000 | |
| ණය ගිණුම (අජිත්) | | 30,000 |
| ගිනිගත් අලාභ | 30,000 | |
| ආයෝජන | 60,000 | |
| 15% ඉතිරි කිරීම් තැන්පතුව | 150,000 | |
| බැංකු මුදල් | 16,000 | |
| මුදල් | 70,000 | |
| | 1,600,000 | 1,600,000 |

පහත අතිරේක තොරතුරු දී ඇත.

i. 2016.12.31 දින තොගය රු. 37,000 ක් වන අතර ඒ තුල රු. 1,000 ක ලිපි ද්‍රව්‍ය තොගයක් අන්තර්ගතය.

ii. විකිණීම හෝ ආපසු එවීමේ පදනම යටතේ ගණුදෙනුකරුවෙකුට යවන ලද රු. 20,000 ක විකුණුම් මිලක් වූ රු. 15,000 ක පිරිවැය සහිත තොගයක් වැරදීමකින් විකුණුම්වල අඩංගු කර ඇත. 2016.12.31 දින වන විට මෙම තොගයෙන් 60% පමණක් විකුණුම් බවට පත් වී ඇත.

iii. අවිනිශ්චිත ගිණුම සැකසී ඇත්තේ පහත වැරදි වලින් බව පසුව අනාවරණය විය.

  a) ණයහිමියන්ට ගෙවු රු. 6,000 ක මුදලක් ණයහිමි ගිණුමට මාරුකර නොතිබුණි.

  b) වරිපනම් ශේෂය රු. 4,000 ක් සහ විගණන ගාස්තු ගිණුමේ ශේෂය රු.3,000 ක් ශේෂ පිරික්සුමට ගෙන නොතිබුණි.

  c) ගැණුම් ජ'නලය එකතු කිරීමේදී රු. 33,000 ක් වැඩියෙන් එකතු කර තිබුණි.

  d) ගෙවල්කුලී ලෙසට ගෙවු රු. 5,000 ක මුදල මුදල් පොතට ගෙන තිබුණත් ගෙවල්කුලී ගිණුමට ගෙන නොතිබුණි. (මලිත්ගේ කුලිය හැර)

iv. උපචිත විදුලිය රු. 2,000 ක් වන අතර ප්‍රචාරණ වියදම් වලින් 40% ක් ඉදිරියට ගෙන යාමට තීරණය කලහ.

v. ලැබිය යුතු බිල්වල අඩංගු රු. 15,000 ක නාමික අගයක් වූ බිල්පතක් රු. 12,500 කට බැංකුවෙන් වට්ටම් කරන ලද නමුත් මේ පිළිබඳව කිසිම සටහනක් පොත්වල අඩංගු වී නැත.

vi. මෝටර් රථ සරල මාර්ග ක්‍රමයට 10% ක් සහ ලීබඩු හීනවන ක්ෂය ක්‍රමයට 5% ක් ක්ෂය කළ යුතුයි.

vii. ගිනිගත් අලාභ ලෙසට දැක්වෙන්නේ ගබඩා ගිනි ගැනීමෙන් සිදු වූ අලාභයකි. මින් 75% ක් රක්ෂණ වන්දි ලෙස ලැබීමට නියමිතය.

ඔබ විසින්,

1. 2016 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
2. 2016 දෙසැම්බර් 31 දිනට හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## උදාහරණ - 15

1. චිරන්ද, කාවින්ද සහ සමීර පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ සඳහන් කොන්දේසි මෙසේය.
2. ලාභාලාභ චිරන්ද, කාවින්ද සහ සමීර අතර 2 : 2 : 1 යන අනුපාතයට බෙදීම.
3. ප්‍රාග්ධනයන් සඳහා 10% පොලී ගෙවීම.
4. ගැනිලි වෙනුවෙන් 5% පොලී අය කිරීම.
5. චිරන්ද සහ කාවින්දට පිළිවෙලින් මාසයකට රු. 2,000 සහ රු. 1,000 බැගින් වේතන වෙන් කිරීම.
6. සමීරගේ නිවාසයක් ව්‍යාපාර ස්ථානයට භාවිතා කරන නිසා මාසයකට රු. 2,000 බැගින් කුලියක් වෙන් කිරීම.
7. චිරන්ද සහ කාවින්ද ව්‍යාපාරයේ ශාඛා 02 ක් භාරව කටයුතු කරන නිසා ශුද්ධ ලාභ බෙදා හැරීමට පෙර චිරන්දට ශුද්ධ ලාභයෙන් 10% කොමිස් මුදලක් ද කාවින්දට ශුද්ධ ලාභයෙන් 8% කොමිස් මුදලක් ද වෙන් කිරීම.

2017.03.31 දින උපුටා ගන්නා ලද ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | | හර | බැර |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | චිරන්ද | | 200,000 |
| | කාවින්ද | | 100,000 |
| | සමීර | 100,000 | |
| ජංගම ගිණුම | චිරන්ද | | 25,000 |
| | කාවින්ද | 10,000 | |
| | සමීර | 5,000 | |
| මෝටර් රථ (පිරිවැයට) | | 120,000 | |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) | | 250,000 | |
| ලී බඩු උපකරන (පිරිවැයට) | | 80,000 | |
| ක්ෂය වෙන් කිරීම් (2016.04.01) | | | |
| | මෝටර් රථ | | 45,000 |
| | ලී බඩු උපකරණ | | 25,000 |
| | ගැණුම් හා විකුණුම් | 460,000 | 780,000 |
| තොගය (2016.04.01) | | 30,000 | |
| ණයගැතියෝ හා ණයහිමියෝ | | 80,000 | 32,000 |
| වේතන | | 60,000 | |
| විදුලිය | | 8,000 | |
| වරිපනම් | | 7,000 | |
| ප්‍රචාරණය | | 32,000 | |
| අඩමාන ණය වෙන් කිරීම (2016.04.01 ) | | | 3,000 |
| ගිනිගත් තොග අලාභ | | 30,000 | |
| ලැබිය යුතු බිල්පත් | | 45,000 | |
| ගැනිලි | චිරන්ද | 24,000 | |
| | කාවින්ද | 12,000 | |
| | සමීර | 10,000 | |
| 10% බැංකු ණය මුදල | | | 50,000 |
| ගෙවූ ණය පොලී | | 4,000 | |
| නැවු ගාස්තු/ආයාත බදු | | 48,000 | |
| බැංකුව | | | 27,000 |
| මුදල් | | 72,000 | |
| | | 1,387,000 | 1,387,000 |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

පහත කරුණුද සැලකිල්ලට ගත යුතුයි.

i. 2017.03.31 දිනට තොගය රු. 34,000 කට ගණනය කරන ලදී.

ii. වර්ෂය තුළදී රු. 10,000 ක ලීබඩු උපකරණ රු. 8,000 කට විකුණා ඇත. මේ පිළිබඳ කිසිදු සටහනක් පොත්වල තබා නැත. මෙම ලී බඩු මිලදී ගෙන තිබුණේ 2015.04.01 දිනදීය.

iii. ණයගැතියන් වෙනුවෙන් 10% ක අඩමාන ණය වෙන්කිරීමක් පවත්වාගෙන යා යුතුයි.

iv. වත්කම් ක්ෂය පහත පරිදි විය යුතුයි.

| | |
|---|---|
| මෝටර් රථ (පිරිවැයට) | 10% |
| ලී බඩු උපකරණ (හීනවන ක්ෂය ක්‍රමයට) | 20% |

v. මාර්තු10 දින දී රු.10000ක නාමික අගයක් වු ලැබිය යුතු බිල්පත් බැංකුවෙන් වට්ටම් කිරීමෙන් රු,8500 ක් ලැබී තිබුණි.මෙම බිල් වට්ටම් කිරීම පිළිබඳව කිසිවක් පොත්වල ගලපා නැත.

vi. තොග අලාභයෙන් 80% ක් වෙනුවෙන් රක්ෂණ වන්දි ලැබීමට නියමිතය.

vii. උපචිත විදුලිය රු. 1,500 ක් වන අතර ප්‍රචාරණ වියදමින් 40% ක් 2015-2016 වර්ෂය වෙනුවෙන් ඉදිරියට ගෙන යා යුතුය.

viii. 2017.03.31 දිනට විගණන ගාස්තු ලෙසට රු. 10,000 ක් වෙන් කළ යුතුය.

ඔබ විසින්,

1. 2017.03.31 න් අවසන් වර්ෂය වෙනුවෙන් වෙළඳ හා ලාභාලාභ ගිණුම ද, (ආදායම් ප්‍රකාශය)
2. හවුල්කරුවන්ගේ ජංගම ගිණුම
3. 2017.03.31 දිනට ශේෂ පත්‍රය ද පෙන්වන්න. (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය)

## හවුල් ව්‍යාපාරයක සංයුතිය වෙනස්වීමකදී අවසන් ගිණුම් පිළියෙල කිරීම

මෙහිදී අවසන් ගිණුම් පිළියෙල කිරීමට ප්‍රථම, හවුල් ව්‍යාපාරයක සංයුතිය වෙනස් වන ආකාරයත් හා එහිදී අදාලව සිදුකළ යුතු ගැලපීම් කිහිපයත් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාගත යුතුය.

### හවුල් ව්‍යාපාරයක සංයුතිය වෙනස් වන ආකාර

හවුල් ව්‍යාපාරවල අයිතිය වෙනස් වීම සංයුතිය වෙනස් වීම ලෙස හඳුන්වයි. හවුල් ව්‍යාපාරවල හවුල්කරුවන්ගේ අයිතිය වෙනස් වීම සිදුවන අවස්ථා කිහිපයකි. ඒවානම්,

1. හවුල්කරුවකු බඳවා ගන්නා විට
2. සිටින හවුල්කරුවකු ඉවත්ව යන විට
3. හවුල්කරුවන් අතර ලාභ අලාභ අනුපාතය වෙනස් කරන විට
4. හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම
5. හවුල් ව්‍යාපාරය වෙනත් ව්‍යාපාරයක් සමග සංයෝජනය වන විට
6. හවුල් ව්‍යාපාරය සීමිත සමාගමක් බවට පරිවර්තනය කරන විට

මෙම අදියරේදී අප අධ්‍යනය කරනු ලබන්නේ ඉහත පළමු අවස්ථා 03 යටතේ අවසන් ගිණුම් පිළියෙල කරන ආකාරය පමණි.

## හවුල් ව්‍යාපාරයක සංයුතිය වෙනස් වන විට කළ යුතු ප්‍රධාන ගැලපීම

1. නව ලාභලාභ අනුපාතය තීරණය කිරීම
2. කීර්තිනාමය ගැලපීම
3. ප්‍රත්‍යාගණන ගැලපීම


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

4. ප්‍රාග්ධන ශේෂ ලාභලාභ අනුපාතයට සමාන කිරීම

## 1. නව ලාභලාභ අනුපාතය තීරණය කිරීම

## (Determinination of New Profit Ratio)

හවුල්කරුවකු බඳවා ගන්නා විට

**උදා I :-** අමල්. කමල් ලාභලාභ සමසමව බෙදාගත් හවුල් ව්‍යාපාරයට විමල් ඇතුලත් වීමේදී ඔහුට ලාභයෙන් ලබාදෙන ලදී නව ලාභලාභ අනුපාතය ගණනය කරන්න.

**උදා II:-** සුනිල්, සරත් 2 : 1 අනුපාතයට ලාභලාභ බෙදාගත් හවුල් ව්‍යාපාරයටලාභයෙන් සුගත් බඳවා ගන්නා ලදී. ඉතිරි ලාභය පැරණි හවුල්කරුවන් පැරණි අනුපාතයට බෙදා ගන්නා ලදී. නව ලාභලාභ අනුපාතය ගණනය කරන්න.

**උදා III:-** කමල්, පියල් 3 : 2 ලාභලාභ බෙදා ගන්නා හවුල් ව්‍යාපාරයට ලාභයෙන් සඳහා රනිල් බඳවා ගන්නා ලදී. පැරණි හවුල්කරුවන් ඉතිරි ලාභය 5 : 4 අනුපාතයට බෙදා ගන්නේ නම් නව ලාභලාභ අනුපාතය ගණනය කරන්න.

කැපකල අනුපාතය

**නව හවුල්කරුගේ ලාභ කොටස වෙනුවෙන් පැරණි හවුල්කරුවන්ට අහිමි වන ලාභ කොටස කැපකල අනුපාතය ලෙස හඳුන්වයි.**

**උදා IV:-** ඉහත උදාහරණ උදා: i. ii. iii. සඳහා කැපකල අනුපාතය ගණනය කරන්න.

සිටින හවුල්කරුවකු ඉවත්ව යන විට

**උදා V:-** කමල්, පියල්, රනිල් 3 : 2 : 1 අනුපාතයට ලාභලාභ බෙදාගන්නා හවුල් ව්‍යාපාරයෙන් රනිල් විශ්‍රාම ගිය පසු ඉතිරි ලාභය පැරණි හවුල්කරුවන් සම සමව බෙදා ගැනීමට තීරණය කරන ලදී. නව ලාභලාභ අනුපාතය ගණනය කරන්න.

**උදා VI:-** මාල, වළලු හා මුදු 4 : 3 : 1 ට ලාභලාභ බෙදාගත් හවුල් ව්‍යාපාරයෙන් මුදු විශ්‍රාම ගිය පසු මාල හා වළලු දෙදෙනා ඉතිරි ලාභය 3 : 2 අනුපාතයට බෙදා ගන්නා ලදී. නව ලාභලාභ අනුපාත ගණනය කරන්න.

භුක්ති විදීමේ අනුපාතය

හවුල්කරුවකු විශ්‍රම ගිය පසු එම විශ්‍රාම ගිය හවුල්කරුගේ ලාභ කොටස **පැරණි හවුල්කරුවන් භුක්ති විදින** අනුපාතය මෙනමින් හඳුන්වයි.

**උදා VII:-** ඉහත උදාහරණ (v), (vi) සඳහා භුක්ති අනුපාතය ගණනය කරන්න.

## 2. කීර්තිනාමය ගැලපීම

## (Goodwill Adjustment)

කීර්තිනාමය පිළිබඳ විවිධ ආයතන සහ පුද්ගලයින් විවිධ අයුරින් නිර්වචන ඉදිරිපත් කර ඇත. එම නිර්වචන අතුරින් කිහිපයක් පහත වේ.

1. වරක් පැමිණි ගණුදෙනුකරුවකු නැවත වරක් ගෙන්වා ගැනීමේ හැකියාවන්,
2. ව්‍යාපාරයේ වැඩිපුර ගණුදෙනුකරුවන් ප්‍රමාණයක් රඳවා ගැනීමෙන් විකුණුම් ආදායම් වැඩිකර ගැනීමේ හැකියාව
3. ව්‍යාපාරයක අයිතිකරුවන් වෙනස් වුවද ආදායම් ඉපයීමේ ශක්තිය අඩු නොවීමේ හැකියාව
4. අනාගත ලාභ ඉපයීමේ හැකියාව
5. කාලාන්තරයක් තිස්සේ සාර්ථක ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යාමෙන් ගණුදෙනුකරුවන් තුළ ඇති කරගෙන තිබෙන හොඳනාමය.
6. අනිකුත් තරඟකාරී ආයතන අභිබවා වැඩි ආදායම් ඉපයීමේ ශක්තිය


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ඉහත නිර්වචන ඉතා සරලව කීර්තිනාමය පිළබඳ ඉදිරිපත්ව ඇති නිර්වචනයන්ය. වඩා ප්‍රචලිත නිර්වචනය ලෙස 1810 දී විභාගයට ගැණුනු නඩුවකදී එල්ඩන් සාමි නැමති නීතිපතිවරයා ඉදිරිපත් කළ නිර්වචනය වඩා ප්‍රචලිත නිර්වචනය වේ.

**කීර්තිනාමය යනු විකිණීමට යටත් කළ හැකි වත්කමක් වන වරක් පැමිණි ගණුදෙනුකරුවන් නැවත් වරක් ගෙන්වා ගැනීමේ අදෘෂ්‍යමාන බල වේගයකි.**

ඉහත නිර්වචනයට අනුව කීර්තිනාමය සතු ප්‍රධාන ලක්ෂණ කිහිපයකි.

1. විකිණීමට යටත් කළ හැකි දෙයක් වීම.
2. වත්කමක් වීම.
3. ගණුදෙනුකරුවන්ගේ ප්‍රතිචාරයක් තුලින් ඇතිවන්නක් වීම.
4. අස්පෘශ්‍ය වීම.
5. අදෘශ්‍යමාන ශක්තියක් හෝ බලයක් එහි පැවතීම.

විකිණීමට යටත් කළ හැකි අනාගත ලාභ ඉපැයීමේ හැකියාවක් සහිත භෞතික පැවැත්මකින් තොර අස්පෘශ්‍ය වත්කම කීර්තිනාමය ලෙස නිර්වචනය කළ හැක.

**දේපල පිරියත උපකරණ සම්බන්ධයෙන් සැසඳුවිට කීර්තිනාමය තුළ පවතින වෙනස**

| දේපල පිරියත උපකරණ | | කීර්තිනාමය | |
|---|---|---|---|
| (1) | ස්පෘශ්‍ය ස්වාභාවයක් ගනී. | (1) | අස්පෘශ්‍ය ස්වාභාවයක් ගනී. |
| (2) | ආයතනයක් කිසියම් වටිනාකමක් ගෙවා අත්පත් කරගනු ලබන වත්කමකි. | (2) | ආයතනික කටයුතු තුළින් ස්වභාවයෙන් ගොඩනැගෙන්නා වු වත්කමකි. |

කීර්තිනාමය හේතුවෙන් ඇතිවන සියළුම ප්‍රතිලාභ ව්‍යාපාරයේ අයිතිකරුවන් සතුය. ඊට හේතුව ව්‍යාපාරික අයිතිය අයිතිකරුවන් සතුවන බැවින් නිරායාසයෙන් ව්‍යාපාරය තුළ ගොඩනැගෙන වත්කම් ඔවුනට හිමිවිය යුතු වීමයි.

තනි ව්‍යාපාරයක කීර්තිනාමයේ ඇතිවන වාසි සහ අවාසි සියල්ලක්ම එහි අයිතිකරු සතුය. එබැවින් ඒ සදහා විශේෂිත ගිණුම්කරණ ගැලපීම් අවශ්‍ය නොවේ. එහෙත් හවුල් ව්‍යාපාරවල කීර්තිනාමය යන්න වෙනත් ස්වරූපයක් ගනී. කීර්තිනාමය ස්වභායෙන්ම ගොඩනැගෙන වත්කමක් බැවින් එම ස්වාභාවික වත්කමේ අයිතිය ඒ වනතෙක් එය ගොඩනැගීමට දායක වූ අය හට හිමිකරදිය යුතුය.

**උදා:** 2010 වර්ෂයේදී සමන්, තිලක් හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවන් ලෙස සම්බන්ධ වී ව්‍යාපාරය ආරම්භ කරන ලදී. 2017 වර්ෂයේ දී තිස්ස හවුල් ව්‍යාපාරයට ඇතුළත් විය.

සමන්, තිලක් ව්‍යාපාරයේ ආරම්භක හිමිකරුවන්ය. 2017 වන විට ව්‍යාපාරය ගොඩනැගීමට දැඩි කැප කිරීම් ඔවුන් දෙදෙනා සිදුකර ඇත. තිස්ස ඇතුළත් වන අවස්ථාවේ එම කැප කිරීම වෙනුවෙන් කිසියම් ගැලපීමක් සිදු නොවුනහොත් සමන්ට සහ තිලක්ට එය අවාසි දායකය.

ඒ අනුව හවුල් ව්‍යාපාරවල අයිතිය වෙනස්වන විට ඒ වන තෙක් ව්‍යාපාරයට ගොඩනැඟි ඇති කීර්තිනාමය පැරණි හවුල්කරුවන් හට අත්පත් කරදීමට සිදුවේ. එබැවින් හවුල් ව්‍යාපාරවල කීර්තිනාම ගැලපීමක් සිදු කරයි. මෙවැනි කීර්තිනාම ගැලපීමක අවශ්‍යතාවය වනුයේ ව්‍යාපාරයේ අයිතිය වෙනස්වන විට ඒ වනතෙක් ගොඩනැගි ඇති කීර්තිනාමය පැරණි හවුල්කරුවන් සතුවන බැවින් පැරණී හවුල්කරුවන්ට සිදුවන වාසි අවාසි සහගත තත්ත්වයන් වැලැක්විමයි.

<u>හවුල්කරුවකු බඳවා ගැනිමේ දී කීර්තිනාමය සටහන් කිරිම</u>

හවුල්කරුවකු බඳවා ගන්නා විට ව්‍යාපාරයේ කීර්තිනාමය පිළිබද ගැලපීමක් සිදු කිරීම අවශ්‍ය වේ. එවැනි ගැලපීමක් අවශ්‍ය වනුයේ, හවුල් ව්‍යාපාරවල හවුල්කරුවකු ඇතුළත් වන විට ඒ වනතෙක් ගොඩනැඟී ඇති කීර්තිනාමයේ අගය පැරණී හවුල්කරුවන් සතු බැවින් ඔවුනට එම අයිතිය ලබාදීම සඳහායි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

කීර්තිනාමය ව්‍යාපාරය සතු වත්කමකි. එහෙත් එය ගිණුම් පොත් වල බඳවා ගන්නා දිනට පෙන්නුම් කිරීමක් නොකරන ප්‍රමාණය පොත්වල සටහන් කිරීම අවශ්‍ය වේ. එකී වත්කමේ අයිතිය හවුල්කරුවන් සතු වන බැවින් ඔවුනට එම වත්කම බෙදා දීම අවශ්‍ය වේ.

කීර්තිනාමය හවුල්කරුවකු බඳවා ගන්නා විට එම ව්‍යාපාරික කීර්තිනාමය ගැලපීම සිදු කළ හැකි ක්‍රම කිපයකි.

### මුළු කීර්තිනාමය ගැලපීම

1. කීර්තිනාමය වත්කමක් ලෙස පොත්වල පවත්වාගෙන යාම.

| | | | |
|---|---|---|---|
| **කීර්තිනාම ගිණුම** | | **හර** | |
| | **ප්‍රාග්ධන ගිණුම** | | **බැර (පැරණි අනුපාතය)** |

2. කීර්තිනාමය වත්කමක් ලෙස සටහන් කර පසුව ඉවත් කිරීම.

   a) වත්කමක් ලෙස සටහන් කිරීම

| | | | |
|---|---|---|---|
| **කීර්තිනාම ගිණුම** | | **හර** | |
| | **ප්‍රාග්ධන ගිණුම** | | **බැර (පැරණි අනුපාතය)** |

   b) කීර්තිනාමය ඉවත් කිරීම

| | | | |
|---|---|---|---|
| **ප්‍රාග්ධන ගිණුම** | | **හර (නව අනුපාතය)** | |
| | **කීර්තිනාම ගිණුම** | | **බැර** |

3. සම්පූර්ණ කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම මඟින් ගැලපීම.

| | | | |
|---|---|---|---|
| **ප්‍රාග්ධන ගිණුම්** | | **හර (නව අනුපාතය)** | |
| | **ප්‍රාග්ධන ගිණුම්** | | **බැර (පැරණි අනුපාතය)** |

### නව හවුල්කරුගේ කොටස පොත්වල ගලපා ගැනීම

1. නව හවුල්කරු කීර්තිනාම කොටස සඳහා මුදල් රැගෙන ඒම

| | | | |
|---|---|---|---|
| **මුදල් පොත** | | **හර** | |
| | **ප්‍රාග්ධන ගිණුම්** | | **බැර (කැපකල අනුපාතය)** |

2. කීර්තිනාම කොටස සඳහා පසුව මුදල් ගෙන එමට එකඟ වීම. (ණය ගිණුමෙන් ගැලපීම)

| | | | |
|---|---|---|---|
| **කීර්තිනාම ණය ගිණුම** | | **හර** | |
| | **ප්‍රාග්ධන ගිණුම** | | **බැර (කැපකල අනුපාතය)** |

3. නව හවුල්කරුගේ කීර්තිනාම කොටස වත්කමක් ලෙස සටහන් කිරීම.

| | | | |
|---|---|---|---|
| **කීර්තිනාම ගිණුම** | | **හර** | |
| | **ප්‍රාග්ධන ගිණුම** | | **බැර (කැපකල අනුපාතය)** |

4. නව හවුල්කරුගේ කීර්තිනාම කොටස ප්‍රාග්ධන ගිණුමෙන් ගැලපීම (නව හවුල්කරු කීර්තිනාමය සඳහා කිසිදාක මුදල් රැගෙන නොඒම)

| | | | |
|---|---|---|---|
| **නව හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම** | | **හර** | |
| | **පැරණි හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම** | | **බැර (කැපකළ අනුපාතය)** |

5. නව හවුල්කරුගේ කීර්තිනාම කොටස ඔහුගේ ජංගම ගිණුමෙන් ගැලපීම.

| | | | |
|---|---|---|---|
| **නව හවුල්කරුවන්ගේ ජංගම ගිණුම** | | **හර** | |
| | **පැරණි හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම** | | **බැර (කැපකළ අනුපාතය)** |

### නව හවුල්කරුගේ කීර්තිනාම කොටස

හවුල්කරුවකු ඇතුළත් වන විට ව්‍යාපාරයේ මුළු කීර්තිනාමයෙන් නව හවුල්කරු භුක්ති විදින ලාභ කොටසට අදාළ කීර්තිනාම ප්‍රමාණය නව හවුල්කරුගේ කීර්තිනාම කොටස ලෙස හඳුන්වයි. එම කොටස නව හවුල්කරු විසින්,


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

1. මුදලින් හඳුන්වා දීම.
2. ණයක් ලෙස සැලකීම.
3. ප්‍රාග්ධන ගිණුම් මඟින් ගලපා ගැනීම.
4. වත්කමක් ලෙස සටහන් කිරීම වැනි ආකාරයන්ගෙන් කළ හැක.
5. ඉදිරි කාලපරිච්ජේද තුළ ජංගම ගිණුම් ශේෂයෙන් කපා හැරීම.

නව හවුල්කරුගේ කීර්තිනාම කොටස කුමන ක්‍රමයන් මත ගලපා ගනු ලැබුවද, එය පැරණි හවුල්කරුවන්ට කැපකල අනුපාතයට බෙදා දෙනු ලැබේ.

**නව හවුල්කරු බැඳෙන විට ඔහු ව්‍යාපාරයට කීර්තිනාමයක් රැගෙන ඒම (නව හවුල්කරු තමා වෙනුවෙන් කීර්තිනාමයක් බැර කරන ලෙස ඉල්ලීම)**

ඇතුලත් වන හවුල්කරු හවුල් ව්‍යාපාරයට ඔහුගේ කීර්තිනාමයක් රැගෙන ඒම මෙහිදී සිදුවේ. නව හවුල්කරු මෙලෙස ගෙන එන කීර්තිනාමය ගැලපිය හැකි ක්‍රම කිපයකි.

කීර්තිනාමය වත්කම් ලෙස පොත්වල සටහන් කිරීම.

**කීර්තිනාම ගිණුම හර**

**නව හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම බැර**

නව හවුල්කරු රැගෙන එන කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම මඟින් ගැලපීම.

**ප්‍රාග්ධන ගිණුම හර (නව අනුපාතය)**

**ප්‍රාග්ධන ගිණුම බැර**

## උදාහරණ - 16

අමර සහ බන්දු 2 : 1 අනුපාතයට ලාභ බෙදා ගත් හවුල් ව්‍යාපාරයට සිරි ඇතුලත් විය. අමර සහ බන්දු හවුල් ව්‍යාපාරයේ මුළු කීර්තිනාමය 180,000 කට තක්සේරු කරන ලදී. සිරි ඇතුළත් වූ පසු ලාභ අලාභ බෙදා ගැනීම අනුපාතය 3 : 2 : 1 විය.

කීර්තිනාමය ගැලපිය හැකි සියළුම ආකාරයන්ට ජ'නල් සටහන් පෙන්වන්න.

## උදාහරණ - 17

ඈපා රූපා හවුල්කරුවන් සමානව ලාභ බෙදාගත් හවුල් ව්‍යාපාරයට වීනා ඇතුළත් විය. වීනා ඇතුළත් වූ පසු ලාභ බෙදාගත් අනුපාතය 2 : 2 : 1 විය. වීනා ඇතුළත් වන විට පොත්වල 50,000 ක කීර්තිනාමයක් පැවති අතර ව්‍යාපාරික මුළු කීර්තිනාමය 150,000 කට තක්සේරු කරන ලදී. පහත එකිනෙක ක්‍රම වලට අදාළ ජ.නල් සටහන් පෙන්වන්න.

1. මුළු කීර්තිනාමය වත්කමක් ලෙස පවත්වාගෙන යාම.
2. පවතින ශේෂය දිගටම කීර්තිනාම ගිණුමේ පවත්වාගෙන යාම.
3. පොත්වල කීර්තිනාමය සටහන් කර සම්පූර්ණ කීර්තිනාමය පොත් වලින් ඉවත් කිරීම.
4. නව හවුල්කරුගේ කීර්තිනාම කොටස් ප්‍රාග්ධන ගිණුමෙන් ගලපා ගැනීම.

### හවුල්කරුවකු ඉවත්ව යාමේදී කීර්තිනාමය ගැලපීම

හවුල් ව්‍යාපාරවල හවුල්කරුවන් විවිධ හේතූන් මත හවුල් ව්‍යාපාරයෙන් ඉවත්ව යයි හවුල්කරුවකු ඉවත්ව යන විට ඉවත්වන දිනයට ව්‍යාපාරික කීර්තිනාමය තක්සේරු කර පොත් වල සටහන් කිරීමට සිදු වේ. හවුල්කරුවකු ඉවත්ව යන විට කීර්තිනාම ගැලපීම අවශ්‍ය වනුයේ, ඒ වන තෙක් ගොඩනැඟි ඇති කීර්තිනාමයෙහි අයිතිය පැරණි හවුල්කරුවන් සතුය. එයින් කොටසක් ඉවත්වන හවුල්කරුටද අයිතිය එම අයිතිය ගලපා ගැනීම සඳහා ඉවත්ව යාමේදී කීර්තිනාමය සටහන් කිරීමට සිදු වේ.

හවුල්කරුවකු ඉවත්වයන විට, කීර්තිනාමය පොත්වල ගැලපිය හැකි ප්‍රධාන ආකාර කීපයකි.

### මුළු කීර්තිනාමය සටහන් කිරීම

1. කීර්තිනාමය වත්කමක් ලෙස පොත් වල සටහන් කිරීම.

**කීර්තිනාම ගිණුම හර**

**ප්‍රාග්ධන ගිණුම බැර (පැරණි අනුපාතය)**

2. කීර්තිනාමය පොත් වල වාර්තා කර පසුව එය ඉවත් කිරීම.

a) පොත්වල වාර්තා කිරීම.

**කීර්තිනාම ගිණුම හර**

**ප්‍රාග්ධන ගිණුම බැර (පැරණි අනුපාතය)**

b) පොත් වලින් ඉවත් කිරීම

**ප්‍රාග්ධන ගිණුම හර (නව අනුපාතය)**

**කීර්තිනාම ගිණුම බැර**

3. කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුම් මඟින් ගලපා ගැනීම.

**ප්‍රාග්ධන ගිණුම හර (නව අනුපාතය)**

**ප්‍රාග්ධන ගිණුම බැර (පැරණි අනුපාතය)**

### ඉවත්වන හවුල්කරුගේ කොටස ගැලපීම

1. වත්කමක් ලෙස පොත්වල සටහන් කිරීම.

**කීර්තිනාම ගිණුම හර**

**ප්‍රාග්ධන ගිණුම බැර**

2. වත්කමක් ලෙස සටහන් කර පසුව එය ඉවත් කිරීම.

a) වත්කමක් ලෙස සටහන් කිරීම.

**කීර්තිනාම ගිණුම හර**

**ප්‍රාග්ධන ගිණුම බැර**

b) කීර්තිනාම ඉවත් කිරීම

**ප්‍රාග්ධන ගිණුම හර (භුක්ති විඳීමේ අනුපාතය)**

**කීර්තිනාම ගිණුම බැර**

3. ප්‍රාග්ධන ගිණුමින් ගැලපීම.

**ප්‍රාග්ධන ගිණුම හර (භුක්ති විඳීමේ අනුපාතය)**

**ප්‍රාග්ධන ගිණුම බැර**

### ඉවත්ව යන හවුල්කරුගේ කීර්තිනාම කොටස

හවුල්කරුවෙකු ඉවත්ව යන දිනට ව්‍යාපාරයේ මුළු කීර්තිනාමයෙන් ඉවත්ව යන හවුල්කරුට හිමි ප්‍රමාණය (ලාභ කොටසට අදාළ ප්‍රමාණය) ඉවත්ව යන හවුල්කරුගේ කීර්තිනාම කොටස ලෙස හඳුන්වයි. ඉවත්ව යන හවුල්කරුගේ කොටස ඔහුට හිමි වත්කමකි. ඉවත්ව යන හවුල්කරුගේ කොටස ගැලපිය හැකි ක්‍රම කිහිපයකි.

1. කීර්තිනාම ගිණුමක් විවෘත කිරීම.
2. කීර්තිනාම ගිණුමක් විවෘත කර පසුව එය ඉවත් කිරීම.
3. කීර්තිනාම කොටස ප්‍රාග්ධන ගිණුමෙන් ගැලපීම.

ඉවත්ව යන හවුල්කරුගේ කොටස පොත්වලින් ඉවත් කරන විට එම ප්‍රමාණයක් නව හවුල්කරුවන් බාර ගත යුත්තේ භුක්ති විඳීමේ අනුපාතයටයි.

## උදාහරණ - 18

අමල් කමල් විමල් 5 : 3 : 2 අනුපාතයට ලාභ අලාභ බෙදාගත් හවුල් ව්‍යාපාරයෙන් විමල් ඉවත් විය. විමල් ඉවත් වන විට ව්‍යාපාරයේ මුළු කීර්තිනාමය 200,000 කට තක්සේරු කරන


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ලදී. විමල් ඉවත්ව ගිය පසු අමල් කමල් 3 : 2 අනුපාතයට ලාභ අලාභ බෙදාගැනීමට එකඟ විය. කීර්තිනාමය ගැලපිය හැකි සියළුම ආකාරයන් මත ජ.නල් සටහන් පෙන්වන්න.

## උදාහරණ - 19

3 : 1 අනුපාතයට ලාභ බෙදාගත් රංග හා තරංග හවුල් ව්‍යාපාරයට සුරංග ඇතුළත් විය. සුරංග ඇතුළත් වූ පසු ලාභ අනුපාතය 3 : 1 : 1 විය. සුරංග තමා වෙනුවෙන් ව්‍යාපාරයෙන් රු. 80,000 ක කීර්තිනාමයක් බැර කරන ලෙස ඉල්ලා සිටියේය.

ඉහත අවස්ථාවට අදාලව,

1. කීර්තිනාමය පොත්වල සටහන් කරයි නම්,
2. කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුමෙන් ගලපයි නම් ජ.නල් සටහන් පෙන්වන්න.

### ලාබ අලාබ අනුපාතය වෙනස් කරන විට කීර්තිනාමය සටහන් කිරීම

හවුල් ව්‍යාපාරවල ලාභ අලාභ බෙදා ගැනීමේ අනුපාතය වෙනස් වන විට ද, කීර්තිනාමය තක්සේරු කර පොත්වල සටහන් කළ හැක ලාභ අනුපාත වෙනස්වීමකදී කීර්තිනාමය ගැලපීමක් අවශ්‍ය වනුයේ එමගින් හවුල්කරුවන්ට සිදුවන වාසි සහ අවාසි සහගත තත්ත්වයන් ඉවත්කිරීම සඳහායි.

ලාභ අනුපාත වෙනස්වීමකදී කීර්තිනාමය ගැලපිය හැකි ප්‍රධාන ක්‍රම 03 කි.

1. කීර්තිනාමය වත්කමක් ලෙස පොත් වල සටහන් කිරීම

**කීර්තිනාම ගිණුම** **හර**

**ප්‍රාග්ධන ගිණුම** **බැර (පැරණි අනුපාතය)**

2. කීර්තිනාමය සටහන් කර පසුව එය ඉවත් කිරීම

a) කීර්තිනාමය සටහන් කිරීම

**කීර්තිනාම ගිණුම** **හර**

**ප්‍රාග්ධන ගිණුම** **බැර (පැරණි අනුපාතය)**

b) කීර්තිනාමය ඉවත් කිරීම

**ප්‍රාග්ධන ගිණුම** **හර (නව අනුපාතය)**

**කීර්තිනාම ගිණුම** **බැර**

3. කීර්තිනාමය ප්‍රාග්ධන ගිණුමෙන් ගැලපීම.

**ප්‍රාග්ධන ගිණුම්** **හර (නව අනුපාතය)**

**ප්‍රාග්ධන ගිණුම්** **බැර (පැරණි අනුපාතය)**

## 3. ප්‍රත්‍යාගණන ගැලපීම

වත්කම් සහ වගකීම් නැවත අගය කිරීම ප්‍රත්‍යාගණනය ලෙස හඳුන්වයි. හවුල් ව්‍යාපාරවල අයිතිය වෙනස් වීමකදී ප්‍රත්‍යාගණන ගැලපීම සිදු කිරීම් අවශ්‍යතාවය පැන නඟී.

**උදා:** හවුල්කරුවන් 2006 දී රු. 500,000 ඉඩමක් සහිතව ව්‍යාපාරයක් ඇරඹීය. 2015 දී C ඇතුලත් විය. 2015 දී C ඇතුලත් වූ පසු දවසක එම ඉඩම විකුණුව හොත් එහි ඇතිවන ලාභ C ටද හිමි වේ. එහෙත් C ට සාපේක්ෂව එම ඉඩම සඳහා A සහ B ගේ දායකත්වය වැඩිය. එබැවින් ස ඇතුලත් වීමේදී එම දායකත්වය වෙනුවෙන් A සහ B ට ගැලපීමක් සිදු කළ යුතුය. එහිදී ඉඩම නැවත අගය කර එහි ලාභ අලාභ C ඇතුලත් වන දිනයේදී A ට සහ B ට හිමි කර දිය යුතුය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

ඒ අනුව, හවුල් ව්‍යාපාරයක අයිතිය වෙනස් වීමකදී පැරණි හවුල්කරුවන්ට සිදු වන අවාසි ඉවත් කර සාධාරණත්වයක් ඇති කිරීම වෙනුවෙන් පැරණි හවුලේ වත්කම් සහ වගකීම් ප්‍රත්‍යාගණනය කිරීමේ අවශ්‍යතාවය පැන නගී.

වත්කම් සහ වගකීම් වල අගය වෙනස්වීමෙන් (ප්‍රත්‍යාගණනයේ) ඇතිවන ලාභ හෝ අලාභ පැරණි හවුල්කරුවන්ට සතු බැවින් එම ලාභ අලාභ හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් වලට ගැලපිය යුතුය. එක් එක් වත්කම වගකීම තුලින් බිහිවන ලාභ අලාභ වෙන් වෙන්ව ගැලපීම වෙනුවට වත්කම් වගකීම් වල සියළු ලාභ අලාභ ගලපා ගැනීම සඳහා ප්‍රත්‍යාගණන ගිණුම නමින් විශේෂිත ගිණුමක් පිළියෙල කරයි. එහි සමස්ත ප්‍රතිඵලය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුමට ගැලපීම සිදු කරයි. ප්‍රත්‍යාගණනය ප්‍රධාන කොටස් 02 කි.

1. නව වටිනාකම් පොත් වලට ඇතුලත් වන පරිදි ප්‍රත්‍යාගණනය කිරීම.
2. නව වටිනාකම් පොත් වලට ඇතුලත් නොවන පරිදි ප්‍රත්‍යාගණනය කිරීම.

ප්‍රත්‍යාගණන ගැලපීමේ දී ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට ප්‍රත්‍යාගණනයට භාජනය කළ යුත්තේ වත්කමේ ශුද්ධ අගයයි. එහිදී ප්‍රත්‍යාගණන ගැලපීම සිදු කරනු ලබන දිනට ශුද්ධ අගය සැලකිය යුතුය ශුද්ධ අගය පහත පරිදි ගණනය කරයි.

**ශුද්ධ අගය = පිරිවැය - සමුච්චිත ක්ෂය**

ණය ගැතියන් ප්‍රත්‍යාගණනය කිරීමේ දී ණයගැතියන්ගේ ශේෂයේ ඇතිවන වෙනස් වීම අඩමාණ ණය වෙන් කිරීමක් ලෙස හඳුනා ගත හැක. ඊට හේතුව ණයගැතියන් වෙළඳපළ තුළ උපලබ්ධි නොවන වත්කමක් බැවිනි.

### නව වටිනාකම් පොත් වලට ඇතුලත් වන පරිදි ප්‍රත්‍යාගණනය කිරීම

වත්කම් සහ වගකීම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් ඇතිවන නව ප්‍රත්‍යාගණිත වටිනාකම ගිණුම් පොත් තුලට සටහන් වන පරිදි ප්‍රත්‍යාගණනය කිරීම මෙහිදී සිදු වේ.

මෙහිදී ප්‍රත්‍යාගණන ගැලපීම සිදු කිරීම සඳහා ප්‍රත්‍යාගණන ගිණුම යොදා ගන්නා අතර ප්‍රත්‍යාගණනයේ සියළුම ගැලපීම් එම ගිණුම සම්බන්ධ කරමින් සිදු කරයි. ඒ සඳහා අදාළ ද්විත්ව සටහන් වනුයේ,

1. වත්කම් වල අගය වැඩි වීම.

| | | |
|---|---|---|
| **වත්කම් ගිණුම** | හර | |
| **ප්‍රත්‍යාගණන ගිණුම** | | බැර |

2. වත්කම් වල අගය අඩු වීම.

| | | |
|---|---|---|
| **ප්‍රත්‍යාගණන ගිණුම** | හර | |
| **වත්කම් ගිණුම** | | බැර |

3. වගකීම් අගය වැඩිවීම.

| | | |
|---|---|---|
| **ප්‍රත්‍යාගණන ගිණුම** | හර | |
| **වගකීම් ගිණුම** | | බැර |

4. වගකීම් අගය අඩු වීම.

| | | |
|---|---|---|
| **වගකීම් ගිණුම** | හර | |
| **ප්‍රත්‍යාගණන ගිණුම** | | බැර |

5. ප්‍රත්‍යාගණන වියදම් දැරීම.

| | | |
|---|---|---|
| **ප්‍රත්‍යාගණන ගිණුම** | හර | |
| **මුදල් ගිණුම** | | බැර |

6. ප්‍රත්‍යාගණන ගිණුමේ ශුද්ධ ශේෂය.

   a) ලාභයක් නම්,

| | | |
|---|---|---|
| **ප්‍රත්‍යාගණන ගිණුම** | හර | |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

**ප්‍රාග්ධන ගිණුම** **බැර (පැරණි අනුපාතය)**

b) අලාභයක් නම්,

**ප්‍රාග්ධන ගිණුම** **හර (පැරණි අනුපාතය)**

**ප්‍රත්‍යාගණන ගිණුම** **බැර**

## උදාහරණ - 20

AB හවුල් ව්‍යාපාරයේ A,B හවුල්කරුවන් ලාභාලාභ පිළිවෙලින් 3 : 2 අනුව බෙදා ගනු ලබයි. හවුල් ව්‍යාපාරයේ 2016 මාර්තු 31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා පහත උපුටාගෙන ඇත.

2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| **වත්කම්** | ^re'& | | |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| **දේපළ, පිරියත හා උපකරණ** | **පිරිවැය** | **සමු: ක්ෂය** | **ශුද්ධ අගය** |
| ගොඩනැගිලි | 50,000 | 5,000 | 45,000 |
| ලී බඩු උපකරණ | 20,000 | 3,000 | 17,000 |
| | 70,000 | 8,000 | 62,000 |
| **ජංගම වත්කම්** | | | |
| අවසන් තොගය | | 40,000 | |
| ණයගැතියෝ | | 30,000 | |
| බැංකු | | 32,000 | 102,000 |
| **මුළු වත්කම්** | | | **164,000** |
| **හිමිකම හා වගකීම** | | | |
| **හිමිකම** | | | |
| ප්‍රාග්ධන ගිණුම් | | | |
| A | | 75,000 | |
| B | | 43,000 | 118,000 |
| ජංගම ගිණුම් | | | |
| A | | 16,800 | |
| B | | 13,200 | 30,000 |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියෝ | | 25,000 | |
| උපචිත විදුලිය | | 1,000 | 26,000 |
| **මුළු හිමිකම සහ වගකීම්** | | | **164,000** |

JMC vLearning "your virtual learning partner"

2016 මාර්තු 31 දින වත්කම් වගකීම් පහත පරිදි ප්‍රත්‍යාගණනය කළහ.

i. ගොඩනැගිලි 5,000 කින් වැඩි වීම.

ii. ලී බඩු 10,000 කින් වැඩි වීම.

iii. ණයහිමියන් 1,000 කින් වැඩි වීම.

iv. ගෙවිය යුතු විදුලි වියදම් රු. 500 කින් කපා හැරීම.

v. අඩමාණ ණය වෙන් කිරීම 100 ක් කිරීම.

vi. රු. 1,200 ක ප්‍රත්‍යාගණන වියදම දැරීම.

පහත දෑ පෙන්වන්න.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

1. ප්‍රත්‍යාගණන ගිණුම් තැබීමේ ජ'නල සටහන් පිළියෙල කරන්න.
2. 2016 මාර්තු 31 දිනට නව මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කරන්න.

## උදාහරණ - 21

3:2 අනුපාතයට ලාභ අලාභ බෙදාගත් හසුන්,කසුන් හවුල් ව්‍යාපාරයේ 2016.12.31 ශේෂ පත්‍රය පහත වේ.

ශේෂ පත්‍රය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනය හසුන් | 425,000 | | **ස්ථාවර වත්කම්** | **පිරිවැය** | **සමු. ක්ෂය** | **ශුද්ධ අගය** |
| කසුන් | 200,000 | 625,000 | ඉඩම් ගොඩනැගිලි | 500,000 | - | 500,000 |
| ජංගම ගිණුම හසුන් | 30,000 | | මෝටර් රථ | 300,000 | 100,000 | 200,000 |
| කසුන් | 25,000 | 55,000 | ලී බඩු | 250,000 | 150,000 | 100,000 |
| | | | | 1,050,000 | 250,000 | 800,000 |
| | | | **ජංගම වත්කම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | තොගය | | 68,000 | |
| බැංකු ණය | | 250,000 | ණයගැතියෝ | | 42,000 | |
| | | | ලැබිය යුතු බිල් | | 30,000 | |
| **ජංගම වගකීම්** | | | ඉදිරියට ගෙවූ ශේෂ | | 5,000 | |
| ණයහිමියෝ | 71,000 | | බැංකු | | 35,000 | |
| ගෙවිය යුතු ප්‍රචාරණ වියදම් | 19,000 | 90,000 | මුදල් | | 40,000 | 220,000 |
| | | 1,020,000 | | | | 1,020,000 |

- 2016.12.31 දසුන් ලාභයෙන් 1/5 ක් සඳහා බඳවා ගන්නා ලදී. ඔහු ප්‍රාග්ධනය ලෙස රු. 100,000 ක මුදලක් රැගෙන එන ලදී.

i. 2016.12.31 දසුන් හවුල් ව්‍යාපාරික කීර්තිනාමය වෙනුවෙන් රු.18,000 ක මුදලක් රැගෙන එන ලදී.

ii. 2016.12.31 වත්කම් සහ වගකීම් නැවත අගය කළ අතර ඒවායේ වටිනාකම් පහත පරිදි විය.

| | |
|---|---|
| ඉඩම් ගොඩනැගිලි | 600,000 |
| මෝටර් රථ | 250,000 |
| ලී බඩු | 120,000 |
| තොගය | 60,000 |
| ණයගැතියන් | 40,000 |
| ණයහිමියන් | 68,000 |

iii. ප්‍රත්‍යාගණන වියදම් රු. 2,000 කි.

iv. ප්‍රචාරණ වියදම් ලෙස තවත් රු. 1000 ක් ගෙවිය යුතුය.

පහත දෑ පෙන්වන්න.

1. ප්‍රත්‍යාගණන ගිණුම
2. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම
3. 2016.12.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න.

## 4. ප්‍රාග්ධන ශේෂ ලාභලාභ අනුපාතයට සමාන කිරීම

හවුල් ව්‍යාපාරවල හවුල්කරුවෙකු බඳවා ගැනීම ඉවත්ව යාම වැනි අවස්ථාවල කීර්තිනාමය ප්‍රත්‍යාගණනය වැනි ගැලපීම් හේතුවෙන් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂ විෂමතාවයන්ට ලක් වේ. එවැනි අවස්ථාවක හවුල්කරුවන්ගේ ලාභ අලාභ අනුපාතය ද වෙනස් වන බැවින් හවුල්කරුවන් අතර සාධාරණව ලාභ බෙදා හැරීමට නම් ප්‍රාග්ධන ගිණුම් ශේෂ ලාභ අලාභ අනුපාතයට ගැලපෙන ලෙසින් සකස් කිරීම් කළ යුතුය. මෙම සකස් කිරීම කළ හැකි ප්‍රධාන පදනම් කිහිපයකි.

1. ප්‍රබල හවුල්කාර පදනම
2. දුබල හවුල්කාර පදනම
3. පොදු පදනම
4. බඳවා ගැනීමක් නම් නව හවුල්කාර පදනම

### ප්‍රබල හවුල්කාර පදනම

ලාභ ඒකකයක් භුක්ති විඳීම වෙනුවෙන් වැඩිම ප්‍රාග්ධන මුදලක් හවුල් ව්‍යාපාරයට යෙදූ හවුල්කරු ප්‍රබල හවුල්කරු ලෙස හඳුන්වයි. වැඩිම මුදලක් යෙදූ හවුල්කරු පදනම් කර ගත් විට ඔහුට අනුරූප වීමට අනෙක් හවුල්කරුවන්ට ව්‍යාපාරයට මුදල් ගෙන ඒමට සිදුවේ. එබැවින් මෙම ක්‍රමය ශුද්ධ වත්කම් වැඩි වීමේ පදනම ලෙස ද හඳුන්වයි.

### දුබල හවුල්කාර පදනම

ලාභ ඒකකයක් භුක්ති විඳීම වෙනුවෙන් අඩුම ප්‍රාග්ධන මුදලක් යෙදූ හවුල්කරු දුබල හවුල්කරු ලෙස හඳුන්වයි. දුබල හවුල්කරු පදනම් කර ගත් විට අනෙක් හවුල්කරුවන්ට වැඩි පුර සම්පත් යොදවා ඇති බැවින් ඔවුනට එම සම්පත් ආපසු රැගෙන යාමේ හැකියාව පවති. එබැවින් මෙම ක්‍රමය ශුද්ධ වත්කම් අඩුවීමේ පදනම ලෙස ද හඳුන්වයි.

ප්‍රබල හෝ දුබල හවුල්කරු හඳුනා ගැනීමේදී එකිනෙක හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂය ඔවුන්ගේ ලාභ ඒකක ගණනින් බෙදීමෙන් කළ හැක.

### පොදු පදනම

පවත්නා ශුද්ධ වත්කම්වල මුළු එකතුවට සරිලන ලෙසින් හවුල්කරුවෙකු හවුල් ව්‍යාපාරයේ ලාභ ඒකකයක් වෙනුවෙන් ආයෝජනය කළ යුතු ප්‍රාග්ධනය මින් හඳුන්වයි. එය පහත පරිදි ගණනය කරයි.

$$\textbf{ලාභ ඒකකයක ප්‍රාග්ධනය} = \frac{\textbf{මුළු ප්‍රාග්ධන ශේෂ එකතුව}}{\textbf{ලාභ අනුපාත එකතුව}}$$

මෙම පදනමට අනුව ගැලපූ විට හවුල් ව්‍යාපාරයේ මුළු ශුද්ධ වත්කම් වෙනස් නොවන බැවින් ශුද්ධ වත්කම් වෙනස් නොවීමේ පදනම ලෙසද හඳුන්වයි. මෙම ක්‍රමයේද ඇතැම් හවුල්කරුවන් අතිරේකව හවුල් ව්‍යාපාරයට අතිරේක ප්‍රාග්ධනය ඉවත් කර ගනී. එම අතිරේක ප්‍රාග්ධන එකතුව සහ අතිරික්ත ප්‍රාග්ධන එකතුව එකිනෙකට සමාන වේ.

### නව හවුල්කාර පදනම

හවුල්කරුවෙකු ඇතුලත් වීමකදී මෙම පදනම යොදා ගත හැක. මෙහිදී නව හවුල්කරු ලාභ ඒකකයක් වෙනුවෙන් යෙදූ ප්‍රාග්ධනය පදනම්ව අනෙක් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂ සකසා ගනු ලැබේ.

## උදාහරණ - 22

ABC සම සමව ලා/ලා බෙදා ගන්නා හවුලේ 2017.03.31 දිනට ප්‍රාග්ධන ශේෂයන් මෙසේය.

| | |
|---|---|
| A | 90,000 |
| B | 50,000 |
| C | 160,000 |

මෙදින නව ලා/ලා අනුපාතය 3 : 1 : 4 : 2 ලෙස වෙනස් කරමින් නවක හවුල්කරුවෙකු ලෙස D බඳවා ගනී. ඔහු රු. 70,000 ක් ප්‍රාග්ධනය ලෙස ගෙන එයි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

පහත එකිනෙක ක්‍රම යටතේ නව ලාභ අනුපාතයට ප්‍රාග්ධන ශේෂ සමාන වන ලෙසින් ගැලපීම් කර ප්‍රාග්ධන ගිණුම් පෙන්වන්න.

i. නවක හවුල්කරු පදනම

ii. පොදු පදනම

iii. ප්‍රබල හවුල්කරු පදනම

iv. දුබල හවුල්කරු පදනම

## උදාහරණ - 23

සජිත්, කාව්‍යා, රම්‍යා හවුල් ව්‍යාපාරයේ ලාභ අලාභ අනුපාතය 5 : 3 : 2 වේ. 2017.03.31 න් අවසන් වර්ෂයේ ගිණුම් ශේෂ කිහිපයක් පහත වේ.

| | | හර | බැර |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | සජිත් | | 600,000 |
| | කාව්‍යා | | 400,000 |
| | රම්‍යා | | 200,000 |
| ගැනිලි | සජිත් | 30,000 | |
| | කාව්‍යා | 40,000 | |
| | රම්‍යා | 20,000 | |
| 2017.03.31 | ශුද්ධ ලාභය | | 280,000 |

හවුල් ගිවිසුමේ පහත කරුණු ද විය.

i. ප්‍රාග්ධනය සඳහා 10% පොලී හිමි වේ.

ii. හවුල්කරුවෙකු ලෙස සජිත්ට 12,000, කාව්‍යාට 10,000, රම්‍යාට 10,000 ක වාර්ෂික වැටුප් හිමිය.

iii. ගැනිලි පොලී ප්‍රතිශතය 5% කි.

iv. රම්‍යාගේ ආදායම 60,000 නොඅඩු වන බව සජිත් හා කාව්‍යා සහතික වී ඇත.

v. රම්‍යාට වාර්ෂිකව ගෙවල්කුලී ලෙස හවුල් ව්‍යාපාරයෙන් 24,000 වාර්ෂික කුලියක් හිමිය. එය ශුද්ධ ලාභයෙන් අඩු වී ඇත.

1. 2017.03.31 න් අවසන් වර්ෂය ලාභ විසර්ජන ගිණුම,
2. ජංගම ගිණුම පෙන්වන්න.

## උදාහරණ - 24

සුරා හා සරා හවුල් ව්‍යාපාරයක නියුතු හවුල්කරුවන් දෙදෙනෙකි. ඔවුන්ගේ ගිවිසුමට අනුව,

1. ලාභලාභ 4 : 3 අනුපාතයට බෙදාගත යුතුය.
2. ප්‍රාග්ධනය සඳහා පොළිය වාර්ෂිකව 10% බැගින් ගෙවිය යුතුය.
3. ගැනිලි සදහා පොළී අය කරනු නොලැබේ.
4. වේතන ලෙස මාසිකව රු. 20,000 හා රු. 15,000 පිළිවෙලින් සුරා හා සරාට හිමිවිය යුතුය.
5. කිසියම් හවුල්කරුවෙකු ව්‍යාපාරයට බඳවා ගන්නේ නම් ඔහු විසින් තම කීර්තිනාම කොටස මුදලින් රැගෙන ආ යුතු වේ.

2015.04.01 දින සිරා හවුල් ව්‍යාපාරයට බඳවාගත් අතර ඔහු බඳවා ගැනීමෙන් පසු ලාභලාභ 4 : 3 : 1 බව තීරණය කරන ලදී. සිරා විසින් ඔහුගේ ප්‍රාග්ධනය හා කීර්තිනාම කොටස ලෙස රු. 37,000,000 මුදලින් ගෙන එන ලදී.

සිරා බඳවා ගැනීමෙන් පසු ඇති වු ගිවිසුමේ කොන්දේසි වලට අනුව,


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

1. ප්‍රාග්ධනය සඳහා පොළිය වාර්ෂිකව 12% දක්වා වැඩි කිරීම.
2. වේතන ලෙස මාසිකව රු.25,000, රු.20,000 හා රු. 15,000 බැගින් සුරා, සරා සහ සිරාට පිළිවෙලින් ගෙවිය යුතුය.
3. හවුල්කරුවෙකු සපයන ණය සඳහා 10% වාර්ෂික පොළියක් ගෙවීම.

2016.03.31 න් අවසන් දිනට සකස් කල ශේෂ පිරික්සුම පහත වේ.

| | (රු..000) | |
|---|---|---|
| ඉඩම් | 60,000 | |
| ගොඩනැගිලි | 64,000 | |
| මෝටර් රථ | 45,000 | |
| යන්ත්‍ර සූත්‍ර | 32,000 | |
| 2015.04.01 ක්ෂය සඳහා වෙන්කිරීම | | |
| ගොඩනැගිලි | | 9,600 |
| මෝටර් රථ | | 18,000 |
| යන්ත්‍ර සූත්‍ර | | 8,000 |
| අඩමාණ ණය සඳහා වෙන් කිරීම | | 200 |
| ප්‍රාග්ධන ගිණුම් (2015.04.01) | | |
| සුරා | | 45.000 |
| සරා | | 40,000 |
| සිරා යෙදූ මුදල | | 37,000 |
| ජංගම ගිණුම් | | |
| සුරා | | 1,500 |
| සිරා | | 8.000 |
| ණයගැතියෝ හා ණයහිමියෝ | 4,200 | 3,200 |
| තොගය 2015.04.01 | 7,000 | |
| ගැණුම් හා විකුණුම් | 60,000 | 114,000 |
| ගෙනවීමේකුලී | 2,000 | |
| තීරු ගාස්තු | 1,000 | |
| රක්ෂණය | 3,000 | |
| වැටුප් හා වේතන | 8,000 | |
| වරිපනම් හා බදු | 1,600 | |
| දුරකථන ගාස්තු | 240 | |
| විදුලිය | 290 | |
| බොල්ණය | 110 | |
| විකුණුම් කොමිස් | 840 | |
| පරිපාලන වියදම් | 1,600 | |
| බෙදාහැරීමේ වියදම් | 700 | |
| ණය ගිණුම - සුරා | | 5,000 |
| බැංකු ණය - 12% | | 7,500 |
| එකතු කල අගය මත බදු ගිණුම | 920 | |
| මුදල් ශේෂය | 1,500 | |
| ආයෝජන ( දිගුකාලින) | 3,000 | |
| | **297,000** | **297,000** |

පහත සඳහන් අතිරේක තොරතුරුද පවති.

i. 2016.03.31 දිනට තොගයේ පිරිවැය රු. 4,600,000 ලෙස ගණනය කර ඇත.

ii. 2015.04.01 දිනට කීර්තිනාමය රු. 56,000,000 විය.

iii. සිරා බඳවාගත් දිනයේදී ඉඩම ප්‍රත්‍යාගණනය කිරීමට තීරණය කල අතර, ඉඩමේ ප්‍රත්‍යාගණිත අගය රු. 63,500,000 ලෙස අගය කරන ලදී.

iv. සුරා විසින් ණය මුදල හවුල් ව්‍යාපාරයට සපයන ලද්දේ 2015.04.01 දිනදීය.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

v. බැංකු ණය මුදල ලබා ගත්තේ 2015.09.30 වන දිනදිය.

vi. 2016 මාර්තු මස මුල ගබඩාවේ ඇති වූ ගින්නකින් රු. 400,000 පිරිවැය වූ භාණ්ඩ සම්පූර්ණයෙන් විනාශයට පත්විය. මේ සඳහා කළ රක්ෂණ වන්දි ඉල්ලීමේදී හානියෙන් 75%ක් රක්ෂණ සංස්ථාව ගෙවීමට එකඟ වී ඇත.

vii. ණයගැතියන්ගෙන් රු. 200,000 ක් බොල් ණය ලෙස කපා හැර ඉතිරි ණයගැතියන්ගෙන් 10%ක අඩමාණ ණය ප්‍රතිපාදනයකින් කළ යුතුය.

viii. මෙම ව්‍යාපාරය සරල මාර්ග ක්ෂය ක්‍රමය යොදා ගනිමින් වාර්ෂිකව පහත ක්ෂය කරනු ලබයි.

| | ඵලදායි ජීවිත කාලය |
|---|---|
| **ගොඩනැගිලි** | වර්ෂ 20 |
| **මෝටර් රථ** | වර්ෂ 05 |
| **යන්ත්‍ර සූත්‍ර** | වර්ෂ 04 |

ix. 2016.03.31 දිනට පහත දුරකථන හා විදුලි බිල් ගෙවා නොතිබුණි. ඒවා පිලිවෙලින් 160,000 ක් හා රු. 110,000 ක් විය.

ඔබ විසින්,

1. 2016.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
2. 2016.03.31 දිනට ශේෂ පත්‍රය
3. ප්‍රාග්ධන හා ජංගම ගිණුම් පිලියෙල කරන්න.

## උදාහරණ - 25

කුසල්, මැතිව්ස් (K&M) හවුල් ව්‍යාපාරයේ කුසල්, මැතිව්ස් යන හවුල්කරුවන් ලාභාලාභ පිළිවෙලින් 4 : 2 අනුව බෙදා ගනු ලබයි. කුසල්, මැතිව්ස් හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත් වලින් 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත උපුටාගෙන ඇත.

2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | (රු.) | | |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| **දේපළ, පිරියත හා උපකරණ** | **පිරිවැය** | **සමු: ක්ෂය** | **ශුද්ධ අගය** |
| ගොඩනැගිලි | 20,000 | - | 20,000 |
| ලී බඩු උපකරණ | 18,000 | - | 18,000 |
| | 38,000 | - | 38,000 |
| **ජංගම වත්කම්** | | | |
| අවසන් තොගය | | 40,000 | |
| ණයගැතියෝ | | 30,000 | |
| ඉදිරියට කළ රක්ෂණය | | 1,000 | |
| බැංකු | | 32,000 | 103,000 |
| **මුළු වත්කම්** | | | **141,000** |
| **හිමිකම හා වගකීම** | | | |
| **හිමිකම** | | | |
| ප්‍රාග්ධන ගිණුම් | | | |
| කුසල් | | 75,000 | |
| මැතිව්ස් | | 40,000 | 115,000 |
| ජංගම ගිණුම් | | | |
| කුසල් | | 6,800 | |
| මැතිව්ස් | | 3,200 | 10,000 |

| | | |
|---|---|---|
| **ජංගම වගකීම්** | | |
| ණයහිමියෝ | 15,000 | |
| උපචිත විදුලිය | 1,000 | 16,000 |
| **මුළු හිමිකම සහ වගකීම්** | | **141,000** |

2016 මාර්තු 31 දිනෙන් අවසන් වු වර්ෂය සඳහා පහත ගණුදෙණු මුදල් පොතෙන් උපුටා ගෙන ඇත.

| | රු. | | රු. |
|---|---|---|---|
| 2015-04-01 දිනට ශේෂය | 32,000 | ගැණුම් | 280,000 |
| විකුණුම් මුදල් ලැබීම් | 355,000 | වේතන | 18,000 |
| | | විදුලි වියදම් | 13,000 |
| | | උපකරණ අලුත්වැඩියා වියදම් | 15,000 |
| | | මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 8,000 |
| | | රක්ෂණ වියදම් | 3,000 |
| | | විවිධ වියදම් | 2,000 |
| | | ගැනිලි - කුසල් | 6,000 |
| | | මැතිව්ස් | 7,000 |
| | | 2016-03-31 දිනට ශේෂය | 35,000 |
| | 387,000 | | 387,000 |

පහත සඳහන් අතිරේක තොරතුරුද පවති.

i. 2016 මාර්තු 31 දිනට තොගය රු.38,000 කට අගය කර ඇත.

ii. රු. 1,500 ක් වු ණයගැතියකු බුන්වත් වු අතර එම ශේෂය කපා හැරීමට තීරණය කරන ලදි.

iii. ප්‍රාග්ධන හා ජංගම ගිණුම් සඳහා පොළි ගණනය කරනු නොලැබේ.

iv. කුසල්ට අයත් ව්‍යාපාරික ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන අතර ඒ සඳහා මාසිකව රු.2,000 ක කුලියක් ගෙවිය යුතුය.

v. මැතිව්ස්ගේ භාර්යාව හවුල් ව්‍යාපාරයේ ගිණුම්කරණ නිලධාරියා ලෙස කටයුතු කරනු ලබන අතර ඒ සඳහා මාසිකව රු.1,500 බැගින් ගෙවිය යුතුය.

vi. හවුල් ව්‍යාපාරය විසින් ගිණුම් වර්ෂය ආරම්භයේදි කීර්තිනාමය ලෙස රු.45,000 ක් වශයෙන් හඳුනා ගන්නා අතර කීර්තිනාම ගිණුමක් පවත්වා නොගැනිමට තීරණය කරන ලදි.

vii. වත්කම් පහත පරිදි ක්ෂය කිරීම සිදු කරනු ලබන අතර ඒ සඳහා අදාල වත්කම් භාවිතා කල කාලය පදනම් කරගෙන සිදු කරනු ලැබේ.

| | ඵලදායි ජීවිත කාලය |
|---|---|
| ගොඩනැගිලි | වර්ෂ 10 |
| යන්ත්‍ර සුත්‍ර | වර්ෂ 05 |

viii. 2016 මාර්තු 31 දිනට ඉදිරියට ගෙවු රක්ෂණය රු.1,000 ක් සහ ගෙවිය යුතු විදුලි වියදම රු.1,500කි.

ix. ඉහත මුදල් පොත තුල සඳහන් උපකරණ අලුත්වැඩියා වියදම් තුල රු.10,000 ක නව උපකරණ මිලදි ගැනිමක් අඩංගු වි ඇත.

x. 2016 මාර්තු 31 දිනට ණයහිමි ශේෂය රු.39,000 කි.

ඔබ විසින්,

1. 2016 මාර්තු 31 දිනෙන් අවසන් වු වර්ෂය ආදායම් ප්‍රකාශය (ලකුණු 10)
2. 2016 මාර්තු 31 දිනට හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ලකුණු 05)


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## උදාහරණ - 26

මනරම් හවුල් ව්‍යාපාරයේ 2017 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධනය - අමර | | 100,000 |
| - මනුර | | 50,000 |
| - නලින් | | 50,000 |
| ජංගම ගිණුම් - අමර | | 20,000 |
| - මනුර | | 5,000 |
| - නලින් | 3,000 | |
| ගැණුම් හා විකුණුම් | 359,030 | 800,400 |
| තොගය (2016.04.01) | 30,000 | |
| වේතන | 92,000 | |
| ගෙවල් කුලි | 10,000 | |
| විදුලිය | 8,000 | |
| 2016.04.01 එකතු කල අගය මත බදු | 16,370 | |
| විකුණුම් වියදම් | 20,000 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 40,000 | |
| ගොඩනැගිලි (පිරිවැයට) | 140,000 | |
| මෝටර් රථ (පිරිවැයට) | 200,000 | |
| කාර්යාලීය උපකරණ (පිරිවැයට) | 60,000 | |
| ප්‍රචාරණය | 20,000 | |
| සංග්‍රහ වියදම් | 2,000 | |
| <u>ක්ෂය වෙන් කිරීම (2016.04.01)</u> | | |
| • ගොඩනැගිලි | | 32,000 |
| • මොටර් රථය | | 15,000 |
| • කාර්යාලීය උපරකරණ | | 25,000 |
| ණයගැතියෝ / ණයහිමියෝ | 60,000 | 25,000 |
| අත ඉතිරි මුදල් | 10,000 | |
| බැංකු මුදල් | 49,000 | |
| ලිපිද්‍රව්‍ය | 3,000 | |
| | **1,122,400** | **1,122,400** |

පහත කරුණු දී තිබේ.

i. අමර හා මනුර 3 : 2 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් ව්‍යාපාරය ආරම්භ කළ හවුල්කරුවන් විය. හවුල් ගිවිසුම අනුව සියළු හවුල්කරුවන්ට ඔවුන්ගේ ස්ථාවර ප්‍රාග්ධනය මත වර්ෂයකට 10% බැගින් ප්‍රාග්ධන පොළීද සෑම හවුල්කරුවෙකුටම මාසයකට රු. 2,000 බැගින් වේතන ද හිමිකම් ලබයි.

ii. 2016 අප්‍රෙල් 01 දිනදී හවුල්කරුවෙකු ලෙසට නලින් බඳවා ගනු ලැබීය. මේ අනුව ඇති වු ගිවිසුමෙහි,

a) ලාභාලාභ 2 : 2 : 1 අනුපාතයට බෙදාගත යුතුයි.

b) ප්‍රාග්ධන පොලී හා වේතන පෙර ගිවිසුමේ කරුණු එසේම තබාගත යුතුයි.

c) මෙදින කීර්තිනාමය රු. 200,000 කට අගය කරන ලදී. එය ප්‍රාග්ධන ගිණුමෙන් ගලපයි.

d) මෙදිනට තිබු වත්කම් පහත පරිදි ප්‍රත්‍යාගණනය කළහ.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | 200,000 | තොගය | 28,000 |
| මෝටර්රථය | 150,000 | ණයගැතියෝ | 58,000 |
| කාර්යාල උපකරණ | 40,000 | | |

e) ප්‍රත්‍යාගණන වියදම් රු.3,000 ක් ගෙවා එය පරිපාලන වියදම් ගිණුමට හර කර ඇත.

f) දේ.පි.උපකරණ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මත 10% කින් ක්ෂය කෙරේ.

iii. 2017 මාර්තු 31 න් අවසන් වර්ෂයට අමර තමාගේ මුළු වේතන මුදලින් ගෙන තිබූ අතර එය වේතන තුල අන්තර්ගතව ඇත.

iv. 2017 මාර්තු 31 දින තොගය රු. 52,000 කට අගය කරන ලදී.

v. උපචිත විදුලිය රු. 2,000 ක් වන අතර ලිපිද්‍රව්‍ය වලින් රු. 1,000 ක ලිපිද්‍රව්‍ය තොගයක් ඉතිරි වී ඇත.

ඔබ විසින්,

1. වෙළඳ හා ලාභාලාභ ගිණුම
2. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්
3. හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්
4. 2017.03.31 දිනට ශේෂ පත්‍රය පෙන්වන්න.

## උදාහරණ - 27

ඒ. එම්. ආයතනය මෝටර් රථවාහන අමතර කොටස් වෙළඳාමේ නිරත පිළිගත් වෙළඳ ආයතනයකි. වර්ෂ ගණනාවක සිට, අමිල, වරුණ සහ කසුන් මෙහි හවුල්කරුවෝ වෙති. ගිණුම් පොත්වලින් 2017 මාර්තු 31 දිනට පහත සඳහන් ශේෂ පිරික්සුම පිළියෙළ කර ඇත.

| | හර (රු. 000) | බැර (රු. 000) |
|---|---|---|
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන හා ජංගම ගිණුම | | |
| අමිල | | 78,000 |
| වරුණ | | 46,200 |
| බසුන් | | 23,400 |
| විකුණුම් | | 1,200,000 |
| මිලදී ගැණුම් | 830,000 | |
| තොගය 2016.04.01 දිනට | 150,000 | |
| වැටුප් හා වේතන | 120,000 | |
| විදුලි බලය | 7,200 | |
| දුරකථන ගාස්තු | 8,400 | |
| ලිපි ද්‍රව්‍ය | 10,800 | |
| පරිපාලන සහ ආයතන වියදම් | 24,000 | |
| විකුණුම් වියදම් | 66,000 | |
| මූල්‍ය වියදම් | 12,000 | |
| ගොඩනැගිලි පිරිවැයට | 160,000 | |
| මෝටර් රථවාහන පිරිවැයට | 56,000 | |
| කාර්යාල උපකරණ පිරිවැයට | 12,000 | |
| 2016.04.01 දිනට ක්ෂය සඳහා වෙන්කිරීම | | |
| ගොඩනැගිල්ල | | 40,000 |
| මෝටර් රථවාහනය | | 22,400 |
| කාර්යාල උපකරණ | | 7,200 |
| ණයගැතියෝ | 140,000 | |

| | | |
|---|---|---|
| බැංකු අයිරාව | | 35,700 |
| අතෙහි ඇති මුදල් | 4,500 | |
| වෙළඳ ණයහිමියෝ | | 148,000 |
| | 1,600,900 | 1,600,900 |

ඔබ වෙත පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත.

i. අමිල, වරුණ සහ කසුන් යන හවුල්කරුවන් ලාභ සහ අලාභ පිළිවෙලින් 3 : 2 : 1 අනුව ඔවුන් අතර බෙදා ගැනීමට මුලදී එකඟ වී ඇත.

ii. 2016.03.31 දින කසුන් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගිය අතර, සෙසු හවුල්කරුවන් වන අමිල සහ වරුණ පහත සඳහන් දෑ සඳහා එකඟවන ලදී.

a) ලාභ සහ අලාභ අමිල සහ වරුණ අතර පිළිවෙලින් 3 : 2 අනුව බෙදා ගැනීමට

b) විශ්‍රාම යෑමේදී කසුන්ට ගෙවිය යුතුව තිබූ මුළු මසකට 1% ක පොළියක් මත ණයක් වශයෙන් ණය ගිණුමකට මාරු කිරීමට

c) විශ්‍රාම යෑමේදී කීර්තිනාමය වශයෙන් කසුන්ට ලැබිය යුතු වූ කොටස රු. 5,000/- ලෙස ගණනය කොට, ඒ සඳහා හවුල් ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ගිණුමක් ඇති නොකිරීමට.

iii. 2016 මාර්තු 31 දිනට තොගය රු. 200,000/- විය.

iv. ස්ථාවර වත්කම් පිරිවැයට පහත පරිදි ක්ෂය කළ යුතුය.

ගොඩනැගිල්ල - වාර්ෂිකව 5% බැගින්

මෝටර් රථවාහන - වාර්ෂිකව 20% බැගින්

කාර්යාල උපකරණ - වාර්ෂිකව 10% බැගින්

පහත සඳහන් දෑ ඔබ විසින් කළ යුතුය.

1. ඉහත දී ඇති විස්තර අනුව 2016.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය ගණනය කරන්න. (ලකුණු 03)

2.

a) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් පිළියෙළ කරන්න. (ලකුණු 03)

b) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභලාභ ගිණුම සහ ලා/ලා විසර්ජන ගිණුම පිළියෙළ කරන්න (ලකුණු 04)

c) 2016 මාර්තු 31 දිනට ශේෂ පත්‍රය පිළියෙළ කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

## උදාහරණ - 28

ආනන්ද, අසිත සහ අනුර යන හවුල්කරුවන් ලාභාලාභ පිළිවෙලින් 5 : 3 : 2 අනුව ඔවුන් අතර බෙදා ගැනීමට මුලදී එකඟ වී ඇත. 3A'S හවුල්කරුවන්ගේ ගිණුම් පොත් වලින් 2015 මාර්තු 31 දිනට පහත සඳහන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙළ කර ඇත.

3A'S හවුල් ව්‍යාපාරයේ

2015 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| **වත්කම්** | (රු.000) | | |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| **දේපළ, පිරියත හා උපකරණ** | **පිරිවැය** | **සමු: ක්ෂය** | **ශුද්ධ අගය** |
| ගොඩනැගිලි | 1,050 | - | 1,050 |
| යන්ත්‍ර සූත්‍ර | 650 | - | 650 |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | | |
|---|---|---|---|
| ලී බඩු උපකරණ | 215 | - | 215 |
| | 1,915 | - | 1,915 |
| ආයෝජන | | 60 | |
| කීර්තිනාමය | | 100 | 160 |
| **ජංගම වත්කම්** | | | |
| අවසන් තොගය | | 650 | |
| ණයගැතියෝ | | 695 | |
| ඉදිරියට කළ ප්‍රචාරණය | | 25 | 1,370 |
| **මුළු වත්කම්** | | | **3,445** |
| **හිමිකම හා වගකීම** | | | |
| **හිමිකම** | | | |
| ප්‍රාග්ධන ගිණුම | | | |
| ආනන්ද | | 450 | |
| අසිත | | 130 | |
| අනුර | | 170 | 750 |
| පොදු සංචිතය | | | 175 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| බැංකු ණය 10% | | 1,500 | 1,500 |
| **ජංගම වගකීම්** | | | |
| ණයහිමියෝ | | 800 | |
| බැංකු අයිරාව | | 220 | 1,020 |
| **මුළු හිමිකම සහ වගකීම්** | | | **3,445** |

2015.04.01 දින අසිත හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගිය අතර, 2015 අප්‍රේල් 01 දිනදී හවුල්කරුවෙකු ලෙසට අනිල්ව බඳවා ගනු ලැබීය. සෙසු හවුල්කරුවන් වන ආනන්ද අනුර සහ අනිල් පහත සඳහන් දෑ සඳහා එකඟවන ලදී.

i. කීර්තිනාමය වශයෙන් රු. 500,000/- ලෙස ගණනය කොට, ඒ සඳහා හවුල් ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ගිණුමක් ඇති නොකිරීමට.

ii. හවුල් ව්‍යාපාරයේ 2015.04.01 දිනට තිබු වත්කම් පහත පරිදි ප්‍රත්‍යාගණනය කළහ.

- ගොඩනැගිලි　　රු. 1,000,000
- යන්ත්‍ර සූත්‍ර　　රු. 520,000

iii. අසිත හවුල් ව්‍යාපාරයේ ආයෝජන 75,000 කට පවරා ගන්නා ලදී.

iv. 2015.03.31 දින ණයගැතියන් සඳහා 20% අඩමාණ ණය වෙන් කිරීමක් කළ යුතුයි.

v. මුළු ප්‍රාග්ධන ගිණුම් ශේෂ 2015.04.01 රු. 1,000,000 ලෙස ගැලපිය යුතුය. ඒ සඳහා හවුල් ව්‍යාපාරයේ නව ලා/ලා අනුපාතය 2 : 2 : 1 අනුව බෙදා ගැනීමට එකඟවන ලදී. හවුල්කරුවන් ව්‍යාපාරයට මුදල් ගෙන ඒමට බැංකු අයිරාවට ගැලපිය යුතුය.

vi. විශ්‍රාම ගිය හවුල්කරුගේ ශේෂය සඳහා ණය ගිණුමක් ඇති කිරීමට එකඟවන ලදී.

ඔබ විසින්,

1. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් පිළියෙළ කරන්න. (ලකුණු 05)
2. 2015.04.01 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙළ කරන්න. (ලකුණු 05)

JMC vLearning "your virtual learning partner"

දූවන ගමන් හවුල් ව්‍යාපාරයේ 2016 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු. 000) | බැර (රු. 000) |
|---|---|---|
| ඉඩම් (පිරිවැයට) | 10,000 | |
| ගොඩනැගිලි (පිරිවැයට) | 15,220 | |
| මෝටර් රථ (පිරිවැයට) | 6,400 | |
| කාර්යාලීය උපකරණ (පිරිවැයට) | 4,660 | |
| විදුලි ජනන යන්ත්‍ර (පිරිවැයට) | 3,250 | |
| <u>ක්ෂය වෙන් කිරීම (2015/04/01)</u> | | |
| ගොඩනැගිලි | | 2,440 |
| මොටර් රථ | | 1,360 |
| කාර්යාලීය උපකරණ | | 1,880 |
| විදුලි ජනන යන්ත්‍ර | | 1,800 |
| විකුණුම් | | 87,436 |
| කුලී ආදායම් | | 7,500 |
| තොගය (2015/04/01) | 43,560 | |
| ගැණුම් | 51,986 | |
| පරිපාලන වියදම් - වේතන | 3,200 | |
| -EPF / ETF | 480 | |
| බෙදාහැරීමේ වියදම් - වේතන | 3,500 | |
| - EPF / ETF | 525 | |
| <u>හවුල්කරුවන්ගේ වේතන</u> | | |
| ඉෂි | 500 | |
| නිෂි | 600 | |
| රිෂි | 250 | |
| විදුලිය | 4,154 | |
| ජල බිල්පත් | 136 | |
| අලෙවි ප්‍රවර්ධන පිරිවැය | 3,250 | |
| ප්‍රචාරණය | 375 | |
| ලිපිද්‍රව්‍ය | 45 | |
| දුරකථන වියදම් | 481 | |
| වෙළඳ ලැබිය යුතු | 28,899 | |
| වෙළඳ ලැබිය යුතු සඳහා ප්‍රතිපාදනය (2015/04/01) | | 420 |
| වෙළඳ ගෙවිය යුතු | | 39,786 |
| උපචිත වියදම් | | 1,839 |
| ආයෝජන - (2016/01/01 දින සිදු කර ඇත) -17% වාර්ෂික | 8,570 | |
| බැංකු මුදල් | | 13,080 |
| <u>ප්‍රාග්ධන ගිණුම්</u> | | |
| ඉෂි | | 10,000 |
| නිෂි | | 8,000 |
| රිෂි යෙදවූ මුදල් | | 5,000 |
| <u>ජංගම ගිණුම්</u> | | |
| ඉෂි | | 5,766 |
| නිෂි | | 3,150 |
| රිෂිගේ ගැනිලි | | 584 |
| | **190,041** | **190,041** |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

i. රිෂි බඳවා ගත් දිනයේදී කීර්තිනාමය රු. 10,750,000 කට අගය කරන ලදී. ඒ සඳහා හවුල් ව්‍යාපාරයේ පොත්වල කීර්තිනාම ගිණුමක් ඇති නොකිරීමට හා එය ප්‍රාග්ධන ගිණුමෙන් ගැලපීමට තීරණය කල අතර ඒ සම්බන්ධ කිසිදු සටහනක් තබා නොමැත.

ii. 2016.03.31 දිනට වෙළඳ බඩු තොගයෙහි පිරිවැය රු. 27,884,000 විය.

iii. හවුල් ව්‍යාපාරය වාර්ෂික ක්ෂය වෙන් කරනුයේ ක්ෂය කිරීමේදී භාවිතයට ගත් කාලය පදනම් කරගනිමින් සරල මාර්ග ක්‍රමය අනුගමනය කරනු ලැබේ.

| | ඵලදායි ජීවිත කාලය |
|---|---|
| **ගොඩනැගිලි** | **වර්ෂ** 20 |
| **මෝටර් රථ** | **වර්ෂ** 10 |
| **කාර්යාලීය උපකරණ** | **වර්ෂ** 04 |
| **විදුලි ජනන යන්ත්‍ර** | **වර්ෂ** 10 |

iv. ඉෂි රිෂි විසින් රු. 60,000 ක ශීතකරණයක් නිවසේ භාවිතය සඳහා ලබා ගත් අතර එය සම්බන්ධ කිසිදු සටහනක් තබා නොමැත.

v. 2016.03.31 දිනට හවුල්කරුවන් විසින් වෙළඳ ලැබිය යුතු සඳහා ප්‍රතිපාදනය ලෙස වෙළඳ ලැබිය යුතු ශේෂයෙන් 10% ක ප්‍රතිපාදනයක් කළ යුතුය.

ඔබ විසින්,

1. 2016.03.31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය (ලකුණු 07)
2. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් (ලකුණු 03)
3. හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් (ලකුණු 03)
4. 2016.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙළ කරන්න. (ලකුණු 07)

JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

# ස්වඅධ්‍යයන අභ්‍යාස

1. a) හවුල් ව්‍යාපාරයක් යන්න නිර්වචනය කර එහි අත්‍යාවශ්‍ය මූලිකාංග නම් කරන්න.
   b) හවුල් ව්‍යාපාරයක ලාභාලාභ විසර්ජනය කිරීම සම්බන්ධව හවුල් ව්‍යාපාර ආඥා පනතේ දැක්වෙන ප්‍රධාන විධිවිධාන කවරේද?
2. a) හවුල් ගිවිසුමක් යන්න අර්ථ දක්වන්න.
   b) හවුල් ගිවිසුමක් නොමැති අවස්ථාවකදී හවුල්කරුවන් කටයුතු කළ යුත්තේ කුමන ආකාරයටද?

## ලාභ විසර්ජනය

3. a) ලාභාලාභ විසර්ජනය ලෙසට සලකන්නේ කුමක්ද?
   b) හවුල් ව්‍යාපාරයක ලාභාලාභ විසර්ජනයක් හා සමාගමක ලාභාලාභ විසර්ජනයක් අතර ඇති වෙනස්කම් කවරේද?
4. තනි ව්‍යාපාරයකට ලාභාලාභ විසර්ජනයක් අවශ්‍ය නොවීමටත් හවුල් ව්‍යාපාරයකට එය අවශ්‍ය වීමටත් හේතුව කුමක්ද?
5. a) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් වෙනුවෙන් “ප්‍රාග්ධන ගිණුමක්” හා “ජංගම ගිණුමක්” වශයෙන් ගිණුම් දෙකක් පවත්වාගෙන යන්නේ ඇයි?
   b) ප්‍රාග්ධන ගිණුමක කළ යුතු වන ගැලපීම් හා ජංගම ගිණුමක කළ යුතු වන ගැලපීම් වෙන්කර ගන්නේ කෙසේද?
6. හවුල් ව්‍යාපාරයක් සම්බන්ධිත ආදායම් / වියදම් ලාභාලාභ ගිණුම සහ ලාභාලාභ විසර්ජන ගිණුම අතර වෙනස තෝරාගනු ලබන්නේ කුමන පදනමක් යටතේද?
7. හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ට දෙන ලාභ කොටස් වලට අතිරේකව,
   a) ප්‍රාග්ධනය වෙනුවෙන් පොළියක්
   b) හවුල්කරුවන්ගේ ශ්‍රමයට වේතනයක් වෙන් කිරීමේ අවශ්‍යතාවයන් මොනවාද?
8. අජිත්, මලිත්, ශිහාන් පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ සඳහන් වන්නේ,
   a. ලාභාලාභ 5 : 3 : 2 අනුපාතයට අජිත්, මලිත්, ශිහාන් අතර බෙදිය යුතුයි.
   b. ප්‍රාග්ධන ගිණුම් සඳහා 10% පොලී වෙන්කළ යුතුයි.
   c. ගැනිලි වෙනුවෙන් 6% ක පොලී අයකල යුතුයි.
   d. අජිත්ට මාසයකට රු.2,000ක් හා මලිත්ට මාසයකට රු.1,000ක වේතන වෙන්කළ යුතුයි.
   e. මලිත්ගේ නිවාසයක් ව්‍යාපාර ස්ථානයට භාවිතා කිරීම වෙනුවෙන් මාසයකට රු. 3,000 ක කුලියක් ගෙවිය යුතුයි.

JMC vLearning "your virtual learning partner"


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

මලිත් වරලත් ගණකාධිකාරීවරයෙකු හෙයින් ඔහු ව්‍යාපාරයේ ගිණුම් කටයුතු වලට සම්බන්ධ වීම වෙනුවෙන් වර්ෂයකට රු. 15,000 ක ගෙවීමක් වෙන් කළ යුතුයි. 2016.03.31 දිනෙන් අවසන් වර්ෂයේ ගිණුම් තැබීමෙන් අනතුරුව ලබාගත් ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර | හැර |
|---|---|---|
| ප්‍රාග්ධනය | | |
| - අජිත් | | 200,000 |
| - මලිත් | | 200,000 |
| - ශිහාන් | | 100,000 |
| ජංගම ගිණුම් (2015.04.01) | | |
| - අජිත් | 4,000 | |
| - මලිත් | - | 20,000 |
| - ශිහාන් | 10,000 | |
| ගැනිලි | | |
| - අජිත් | 12,000 | |
| - මලිත් | 6,000 | |
| - ශිහාන් | 6,000 | |
| ගැණුම් / විකුණුම් | 250,000 | 870,000 |
| මොටර් රථය (පිරිවැයට) | 520,000 | |
| ලිබඩු (පිරිවැයට) | 100,000 | |
| ක්ෂය වෙන් කිරීම් (2015.04.01) | | |
| මොටර් රථය | | 60,000 |
| ලිබඩු | | 25,000 |
| තොගය (2015.04.01) | 42,000 | |
| ආයාත බදු | 35,000 | |
| ණයගැතියෝ / ණයහිමියෝ | 150,000 | 80,000 |
| වේතන | 40,000 | |
| විදුලිය | 16,000 | |
| ප්‍රචාරණය | 32,000 | |
| ලිපිද්‍රව්‍ය | 11,000 | |
| අවිනිශ්චිත ගිණුම | | 15,000 |
| ලැබිය යුතු බිල් | 40,000 | |
| ණය ගිණුම (අජිත්) | | 30,000 |
| කීර්තිනාමය | 50,000 | |
| ගිනිගත් අලාභ | 30,000 | |
| ආයෝජන | 60,000 | |
| 15% ඉතිරි කිරීම් තැන්පතුව | 150,000 | |
| බැංකුව | 16,000 | |
| මුදල් | 20,000 | |
| | 1,600,000 | 1,600,000 |

පහත අතිරේක තොරතුරු දී ඇත.

i. 2016.03.31 දින තොගය රු.37,000ක් වන අතර ඒ තුළ රු.1,000ක ලිපි ද්‍රව්‍ය තොගයක් අන්තර්ගතය.

ii. විකිණීම හෝ ආපසු එවීමේ පදනම යටතේ ගණුදෙනුකරුවෙකුට යවන ලද රු. 20,000 ක විකුණුම් මිලක් වූ රු. 15,000 ක පිරිවැය සහිත තොගයක් වැරදීමකින් විකුණුම් වල අඩංගු කර ඇත. 2016.03.31 දින වන විට මෙම තොගයෙන් 60% පමණක් විකුණුම් බවට පත් වී ඇත.

iii. අවිනිශ්චිත ගිණුම සැකසී ඇත්තේ පහත වැරදි වලින් බව පසුව අනාවරණය විය.

a) ණයහිමියන්ට ගෙවූ රු. 6,000 ක මුදලක් ණයහිමි ගිණුමට මාරුකර නොතිබුණි.

b) වර්පනම් ශේෂය රු. 4,000 ක් සහ විගණන ගාස්තු ගිණුමේ ශේෂය රු.3,000 ක් ශේෂ පිරික්සුමට ගෙන නොතිබුණි.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

c) ගැණුම් ජ'නලය එකතු කිරීමේදී රු. 33,000 ක් වැඩියෙන් එකතු කර තිබුණි.

d) ගෙවල්කුලී ලෙසට ගෙවූ රු. 5,000 ක මුදල මුදල් පොතට ගෙන තිබුණත් ගෙවල්කුලී ගිණුමට ගෙන නොතිබුණි. (මලිත්ගේ කුලිය හැර)

iv. උපචිත විදුලිය රු. 2,000 ක් වන අතර ප්‍රචාරණ වියදම් වලින් 40% ක් ඉදිරියට ගෙන යාමට තීරණය කළහ.

v. ලැබිය යුතු බිල්වල අඩංගු රු. 15,000 ක නාමික අගයක් වූ බිල්පතක් රු. 12,500 කට බැංකුවෙන් වට්ටම් කරන ලද නමුත් මේ පිළිබඳව කිසිම සටහනක් පොත්වල අඩංගු වී නැත.

vi. මෝටර් රථ සරල මාර්ග ක්‍රමයට 10% ක් සහ ලීබඩු හීනවන ක්ෂය ක්‍රමයට 5% ක් ක්ෂය කළ යුතුයි.

vii. ගිනිගත් අලාභ ලෙසට දැක්වෙන්නේ ගබඩා ගිනි ගැනීමෙන් සිදු වූ අලාභයකි. මින් 75% ක් රක්ෂණ වන්දි ලෙස ලැබීමට නියමිතය.

ඔබ විසින්, වෙළඳ හා ලාභලාභ ගිණුමද ලාභ අලාභ විසර්ජන ගිණුමද ශේෂ පත්‍රයද පෙන්වන්න.

9. චිරන්ද, කාවින්ද සහ සමීර පවත්වාගෙන ගිය හවුල් ව්‍යාපාරයේ ගිවිසුමේ සඳහන් කොන්දේසි මෙසේය.

i. ලාභාලාභ චිරන්ද, කාවින්ද සහ සමීර අතර 2 ඃ 2 ඃ 1 යන අනුපාතයට බෙදීම.

ii. ප්‍රාග්ධනයන් සඳහා 10% පොලී ගෙවීම.

iii. ගැනිලි වෙනුවෙන් 5% පොලී අය කිරීම.

iv. චිරන්ද සහ කාවින්දට පිළිවෙලින් මාසයකට රු. 2,000 සහ රු. 1,000 බැගින් වේතන වෙන් කිරීම.

v. සමීරගේ නිවාසයක් ව්‍යාපාර ස්ථානයට භාවිතා කරන නිසා මාසයකට රු. 2,000 බැගින් කුලියක් වෙන්කිරීම.

vi. චිරන්ද සහ කාවින්ද ව්‍යාපාරයේ ශාඛා දෙකක් භාරව කටයුතු කරන නිසා ශුද්ධ ලාභ බෙදා හැරීමට පෙර චිරන්දට ශුද්ධ ලාභයෙන් 10% කොමිස් මුදලක් ද කාවින්දට ශුද්ධ ලාභයෙන් 8% කොමිස් මුදලක් ද වෙන්කිරීම.

vii. සමීර ලබන ආදායම රු. 12,000 ඉක්මවන්නේ නම් ඉන් සිදුවන පාඩුව විද දරා ගැනීමට චිරන්ද විසින් කාවින්දට පොරොන්දු වීම.

2015.12.31 දින උපුටා ගන්නා ලද ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | | හර | බැර |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | චිරන්ද | | 200,000 |
| | කාවින්ද | | 100,000 |
| | සමීර | 100,000 | |
| ජංගම ගිණුම | චිරන්ද | | 25,000 |
| | කාවින්ද | 10,000 | |
| | සමීර | 5,000 | |
| මෝටර් රථ (පිරිවැයට) | | 120,000 | |
| ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට) | | 250,000 | |
| ලී බඩු උපකරන (පිරිවැයට) | | 80,000 | |
| <u>ක්ෂය වෙන් කිරීම් (2015.01.01)</u> | | | |
| | මෝටර් රථ | | 45,000 |
| | ලී බඩු උපකරණ | | 25,000 |
| | ගැණුම් හා විකුණුම් | 60,000 | 780,000 |
| තොගය (2015.01.01) | | 30,000 | |
| ණයගැතියෝ හා ණයහිමියෝ | | 80,000 | 32,000 |
| වේතන | | 60,000 | |


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

| | | |
|---|---|---|
| විදුලිය | 8,000 | |
| වරිපනම් | 7,000 | |
| ප්‍රචාරණය | 32,000 | |
| අඩමාන ණය වෙන් කිරීම (2015.01.01 ) | 3,000 | |
| ගිනිගත් තොග අලාභ | 30,000 | |
| ලැබිය යුතු බිල්පත් | 45,000 | |
| ගැනිලි චිරන්ද | 24,000 | |
| කාවින්ද | 12,000 | |
| සමීර | 10,000 | |
| 10% බැංකු ණය මුදල | | 50,000 |
| ගෙවූ ණය පොලී | 4,000 | |
| නැවු ගාස්තු/ආයාත බදු | 48,000 | |
| බැංකුව | | 27,000 |
| මුදල් | 72,000 | |
| | 1,387,000 | 1,387,000 |

පහත කරුණුද සැලකිල්ලට ගත යුතුයි.

i. 2015.12.31 දිනට තොගය රු. 34,000 කට ගණනය කරන ලදී.

ii. හවුල්කරුවන් විසින් ගැනිලි සිදු කර ඇත්තේ පහත පරිදිය.

චිරන්ද සෑම මසකම මුලදී රු. 1,500 බැගින් ද, ජුලි මස සිට සෑම මසකම මැදදී රු.1,000 බැගින්ද කාවින්ද සෑම මසකම මැදදී රු. 500 බැගින්ද මාර්තු මාසයේ සිට සෑම මසකම අගදී රු. 600 බැගින්ද,

iii. වර්ෂය තුළදී රු. 10,000 ක ලීබඩු උපකරණ රු. 8,000 කට විකුණා ඇත. මේ පිළිබඳ කිසිදු සටහනක් පොත්වල තබා නැත. මෙම ලී බඩු මිලදී ගෙන තිබුණේ 2013.01.01 දිනදීය.

iv. ණයගැතියන් වෙනුවෙන් 10% ක අඩමාන ණය වෙන්කිරීමක් පවත්වාගෙන යා යුතුයි.

v. වත්කම් ක්ෂය පහත පරිදි විය යුතුයි.

| | |
|---|---|
| මෝටර් රථ (පිරිවැයට) | 10% |
| ලී බඩු උපකරණ (හීනවන ක්ෂය ක්‍රමයට) | 20% |

vi. දෙසැම්බර් 10 දින දී රු. 10,000 ක නාමික අගයක් වූ ලැබිය යුතු බිල්පත් බැංකුවෙන් වට්ටම් කිරීමෙන් රු. 8,500 ක් ලැබී තිබුණි. මෙම බිල් වට්ටම් කිරීම පිළිබඳව කිසිවක් පොත්වල ගලපා නැත.

vii. විකිණීම හෝ ආපසු එවීමේ පදනම යටතේ ව්‍යාපාරය රු. 20,000 පිරිවැය වූ රු. 25,000 ක විකුණුම් මිලක් සහිත භාණ්ඩ තොගයක් ගණුදෙනුකරුවන්ට යවා ඇත. දෙසැම්බර් 31 දින වන විටත් මේවා විකුණුම් බවට පත් වී නොමැත. නමුත් ව්‍යාපාරයේ පොත් තබන්නන් විසින් මේවා දැනට වැරදීමකින් විකුණුම් ලෙසට වාර්තා කර තිබේ.

viii. තොග අලාභයෙන් 80% ක් වෙනුවෙන් රක්ෂණ වන්දී ලැබීමට නියමිතය.

ix. උපචිත විදුලිය රු. 1,500 ක් වන අතර ප්‍රචාරණ වියදමින් 40% ක් 2006 වර්ෂය වෙනුවෙන් ඉදිරියට ගෙන යා යුතුය.

x. විගණන ගාස්තු ලෙසට රු. 10,000 ක් වෙන් කළ යුතුය.

ඔබ විසින්,

1. 2015.12.31 න් අවසන් වර්ෂය වෙනුවෙන් වෙළඳ හා ලාභාලාභ ගිණුම ද,
2. හවුල්කරුවන්ගේ ජංගම ගිණුම ද,
3. 2015.12.31 දිනට ශේෂ පත්‍රය ද පෙන්වන්න.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

## නව හවුල්කරුවෙකු බඳවා ගැනීම - අවසාන ගිණුම්

10. සමනල හවුල් ව්‍යාපාරයේ 2015 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර | බැර |
|---|---|---|
| ප්‍රාග්ධනය - අජිත් | | 100,000 |
| - මලිත් | | 50,000 |
| - ශිහාන් | | 50,000 |
| ජංගම ගිණුම් - අජිත් | | 20,000 |
| - මලිත් | | 5,000 |
| - ශිහාන් | 3,000 | |
| ගැණුම් හා විකුණුම් | 359,030 | 800,400 |
| තොගය (2014.04.01) | 30,000 | |
| වේතන | 92,000 | |
| ගෙවල් කුලී | 10,000 | |
| විදුලිය | 8,000 | |
| 2014.04.01 එකතු කළ අගය මත බදු | 16,370 | |
| විකුණුම් වියදම් | 20,000 | |
| අනෙකුත් පරිපාලන වියදම් | 40,000 | |
| ගොඩනැගිලි (පිරිවැයට) | 140,000 | |
| මෝටර් රථය (පිරිවැයට) | 200,000 | |
| කාර්යාලීය උපකරණ (පිරිවැයට) | 60,000 | |
| ප්‍රචාරණය | 20,000 | |
| සංග්‍රහ වියදම් | 2,000 | |
| **ක්ෂය වෙන් කිරීම (2014.04.01)** | | |
| ගොඩනැගිලි | | 32,000 |
| මොටර් රථය | | 15,000 |
| කාර්යාලීය උපකරණ | | 25,000 |
| ණයගැතියෝ / ණයහිමියෝ | 60,000 | 25,000 |
| අත ඉතිරි මුදල් | 10,000 | |
| අවිනිශ්චිත ගිණුම | 8,000 | |
| බැංකු මුදල් | 41,000 | |
| ලැබිය යුතු බිල් | 3,000 | |
| | **1,122,400** | **1,122,400** |

පහත කරුණු දී තිබේ.

i. අජිත් හා මලිත් 3 : 2 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් ව්‍යාපාරය ආරම්භ කළ හවුල්කරුවන් විය. හවුල් ගිවිසුම අනුව සියළු හවුල්කරුවන්ට ඔවුන්ගේ ස්ථාවර ප්‍රාග්ධනය මත වර්ෂයකට 10% බැගින් ප්‍රාග්ධන පොලීද සෑම හවුල්කරුවෙකුටම මාසයකට රු. 2,000 බැගින් වේතන ද හිමිකම් ලබයි.

ii. 2015.03.31 දිනදී හවුල්කරුවෙකු ලෙසට ශිහාන් බඳවා ගනු ලැබීය. මේ අනුව ඇති වු ගිවිසුමෙහි,

a) ලාභාලාභ 2 : 2 : 1 අනුපාතයට බෙදාගත යුතුයි.

b) ප්‍රාග්ධන පොලී හා වේතන පෙර ගිවිසුමේ කරුණු එසේම තබාගත යුතුයි.

c) මෙදින කීර්තිනාමය රු. 200,000 කට අගය කරන ලද අතර රු. 50,000 ක වටිනාකමක් ව්‍යාපාරයේ පොත්වල පෙන්විය යුතුයි.

iii. 2015 මාර්තු 31 න් අවසන් වර්ෂයට අජිත් තමාගේ මුළු වේතන මුදලින් ගෙන තිබු අතර එය වේතන තුල අන්තර්ගතව ඇත.

iv. 2015 මාර්තු 31 දින තොගය රු. 52,000 කට අගය කරන ලදී.

v. අවිනිශ්චිත ගිණුම නිර්මාණය වී ඇත්තේ,


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd

a) ගෙවල් කුලි ලෙසට ගෙවන ලද රු. 12,000 ක් ගෙවල් කුලී ගිණුමට ගෙන නොතිබුණි.

b) ණයහිමි ගිණුමේ බැර පැත්ත රු. 4,000 ක් අඩුවෙන් එකතු කර තිබුණි.

vi. 2015 මාර්තු 31 උපචිත විදුලිය රු. 2,000 ක් වී ඇත.

vii. ශේෂ පිරික්සුමේ දක්වා ඇති ගැණුම් සහ විකුණුම් තුළ ඩ්ඹ මුදල් අන්තර්ගත වන අතර ඒ සඳහා ගැලපීම් කර නොමැත.

ඔබ විසින්,

1. අවිනිශ්චිත ගිණුම හා වැරදි නිවැරදි කිරීමේ ජ.ර්නල් සටහන්

2. වෙළඳ හා ලාභාලාභ ගිණුම

3. හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්

4. හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්

5. 2015.03.31 දිනට ශේෂ පත්‍රය පෙන්වන්න.

11. ඉෂි හා නිෂි හවුල් ව්‍යාපාරයක නියුතු හවුල්කරුවන් 02 කි. ඉෂි හා නිෂි විසින් දූවන ගමන් නමින් විදුලි උපකරණ අලෙවි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදි. ඔවුන්ගේ ගිවිසුමට අනුව,

i. ලාභලාභ 3 : 2 අනුපාතයට බෙදාගත යුතුය.

ii. ප්‍රාග්ධනය සඳහා පොලිය වාර්ෂිකව 10% බැගින් ගෙවිය යුතුය.

iii. ගැනිලි සදහා පොලී අය කරනු නොලැබේ.

2015.04.01 දින රීෂි හවුල් ව්‍යාපාරයට බඳවාගත් අතර. රීෂි විසින් ප්‍රාග්ධනය ලෙස රු. 5,000,000 මුදලින් ගෙන එන ලදී.


© 2020 JMC Jayasekera Management Centre (Pvt) Ltd